

මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2021

වාර්ෂික කාර්යසාධන වාර්තාව

වැය ශීර්ෂ අංකය - 328

2021 වාර්ෂික කාර්යසාධන වාර්තාව

මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 328

9 වන මහල, සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල.
ටෙලි : 0112 187 133 / 0112 186 171

පටුන

පිටු අංකය

1. පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම 08
1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු 09
1.3 සංවිධාන සටහන 10
1.4 කාර්ය මණ්ඩල තොරතුරු 11
1.5 දෙපාර්තමේන්තුවේ අංශ 13
1.6 දෙපාර්තමේන්තුවේ අංශයන්හි කාර්යභාරය 15

2. පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය 18
2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක 37

3. පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 42
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 43
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 45
3.4 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 47
3.5 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 47
3.6 මු.රෙ 208 ප්‍රකාරව ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 47
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 47
3.8 විගණන වාර්තාව 50

4. පරිච්ඡේදය 04 -කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය 62

5. පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 64
5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 66

6. පරිච්ඡේදය 06 -මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 68
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම 68
6.3 මානව සම්පත් සංවර්ධනය 68
6.4 ආයතනයේ කාර්ය සාධනය සඳහා පුහුණු වැඩසටහන්හි දායකත්වය 69

7. පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 74



මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව එවකට කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ 2010 පෙබරවාරි 2 වන දින අංක 1640/31 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2010 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටවනු ලද ගුණාත්මක හා නිපුණතා සපිරි මානව සම්පතක් බිහි කිරීම අරමුණු කොට පිහිටුවනු ලැබූ දෙපාර්තමේන්තුවකි.









ශ්‍රී ලංකාව තුළ මානව සම්පත සංවර්ධනය කරමින් තරුණ සමාජයේ විරැකියාව තුරන්කර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම, ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, වෘත්තීය මාර්ගෝපදේශනය හා රැකියා උත්පාදනය තුළින් ජාතික ආර්ථිකයට තරුණ ප්‍රජාවේ දායකත්වය ලබා ගැනීම යන අරමුණු සපුරා ගැනීම සඳහා මුල් කාලීනව තරුණ හා යෞවන කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධව එහි වෘත්තීය මාර්ගෝපදේශ හා රැකියා සැලසුම් අංශයක් ලෙස මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක විය.

01

පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1. හැඳින්වීම

මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

රටක් සතු සීමිත සම්පත් ප්‍රශස්තව උපයෝජනය කිරීම රටේ ප්‍රගමනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වේ. පවත්නා නිශ්ක්‍රිය (passive) සම්පත් ප්‍රශස්ථ ලෙස උපයෝජනය සඳහා සක්‍රිය හා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් මානව සම්පතක් නොමැති වීම රටක ප්‍රගමනය සඳහා බාධාකාරීව පවතී.රටක් සතු සම්පත් වලට වඩා වැදගත් වන මානව සම්පත සංවර්ධනය සහ කළමනාකරණය රටක සංවර්ධන ක්‍රියාවලියේ අනිවාර්ය සහ අත්‍යවශ්‍ය අංගයක් වන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාව තුළ මානව සම්පත සංවර්ධනය කරමින් තරුණ ප්‍රජාව අතර විරැකියාව තුරන්කර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම, ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, වෘත්තීය මාර්ගෝපදේශය හා රැකියා උත්පාදනය තුළින් ජාතික ආර්ථිකයට තරුණ ප්‍රජාවේ දායකත්වය ලබා ගැනීම යන අරමුණු සපුරා ගැනීම සඳහා2010.02.12 දිනැති අංක 1640/34 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2010.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදි.

1.1ප්‍රධාන කාර්යන්

1. වෘත්තීය මාර්ගෝපදේශනසේවා සැපයීම
2. ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදා හැරීම
3. මහජන රැකියා සේවා ලබාදීම
4. ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීම
5. මානව සම්පත් සංවර්ධනයට අදාල කටයුතු ඉටු කිරීම

1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු



අරමුණු

- ❖ 2023 වර්ෂයේදී ශ්‍රම වෙළඳපොල තොරතුරු පද්ධතියක් ස්ථාපනය වීම.
- ❖ 2025 වර්ෂය වන විට පිරිමි ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 70% සිට 73% දක්වාද, කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 32% සිට 34.5% දක්වාද, 2030 දී පිරිමි ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 75% දක්වාද, කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 45% දක්වා වැඩි වීම.
- ❖ පුහුණු / වෘත්තීමය ශ්‍රමිකයන් විදෙස් ගත වීමේ ප්‍රතිශතය 2030 වන විට දෙගුණයක් බවට පත් කිරීම (36.5% සිට 73%) හා විදෙස් ගතවන නුපුහුණු ශ්‍රමිකයින් විදෙස්ගත වීම අධෛර්යමත් කිරීම.
- ❖ 2025 වන විට EDBI දර්ශකයෙහි ශ්‍රී ලංකාව සිටින ස්ථානය 99 සිට 89 දක්වා ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්තිමය සංවාදයක් ඇති වීම.
- ❖ 2023 වන විට වෘත්තීය මාර්ගෝපදේශ විෂය ක්ෂේත්‍රය විධිමත් භාවයට පත් වීම.
- ❖ 2030වන විට දේශීය හා ගෝලීය ඉල්ලුම සපුරාලීම සඳහා කාර්යක්ෂම හා සදාචාරාත්මක ශ්‍රම බලකායක් ඇති කිරීම සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ ලබා දීම.

1.4 සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී.ල.ප.සේ (විශේෂ)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
(විශේෂ ශ්‍රී.ල.ප.සේ)
අධ්‍යක්ෂ (පාලන) (D1)
ශ්‍රී.ල.ප.සේ I ශ්‍රේණිය
අධ්‍යක්ෂ (සැලසුම් හා පරිපාලන) (D2)
ශ්‍රී.ල.ප.සේ I ශ්‍රේණිය
අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ හා ජාතාන්තර සහයතා) (D2)
ශ්‍රී.ල.ප.සේ I ශ්‍රේණිය
අධ්‍යක්ෂ (රැකියා ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ) (D4)
ශ්‍රී.ල.ප.සේ I ශ්‍රේණිය
අධ්‍යක්ෂ (මහජන රැකියා සේවය හා රැකියා නිර්මාණ) (D5)
ශ්‍රී.ල.ප.සේ I ශ්‍රේණිය
ප්‍රධාන ගණකාධිකාරී (CA 01)
ශ්‍රී.ල.ප.සේ I ශ්‍රේණිය
නීයෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (පාලන) (DD/AD 1)
ශ්‍රී.ල.ප.සේ II / III ශ්‍රේණිය
නීති නිලධාරී (Legal 01) (දෙපාර්තමේන්තුගත)
නීයෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා ප්‍රගති මෙහෙයුම්) (DD/AD 2)
ශ්‍රී.ල.ප.සේ I/III ශ්‍රේණිය
නීයෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ග්‍රාම වෙළඳපොළ නොතේරුණු හා පරිසරය) (DD/AD 3)
ශ්‍රී.ල.ප.සේ I/III ශ්‍රේණිය
නීයෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (රාජකීය මානව සම්පත් හා යැපීක්ෂා ප්‍රතිපත්ති) (DD/AD 4)
ශ්‍රී.ල.ප.සේ I/III ශ්‍රේණිය
නීයෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ජාතාන්තර සහයතා) (DD/AD 5)
ශ්‍රී.ල.ප.සේ I/III ශ්‍රේණිය
නීයෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (රැකියා ප්‍රවර්ධන) (DD/AD 6)
ශ්‍රී.ල.ප.සේ I/III ශ්‍රේණිය
නීයෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශ) ශ්‍රී.ල.ප.සේ I/III ශ්‍රේණිය
නීයෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (මහජන රැකියා සේවය හා රැකියා නිර්මාණ) (DD/AD 8)
ශ්‍රී.ල.ප.සේ I/III ශ්‍රේණිය
ගණකාධිකාරී (AC 01)
ශ්‍රී.ල.ප.සේ I/III ශ්‍රේණිය
අභ්‍යන්තර විගණක (AC 02)
ශ්‍රී.ල.ප.සේ I/III ශ්‍රේණිය
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක I / II ශ්‍රේණිය (සිංහල - දෙමළ)
නොතේරුණු කාන්තමණ නිලධාරී I/II/III ශ්‍රේණිය
සංඛ්‍යා ලේඛන නිලධාරී I/II/III ශ්‍රේණිය
වාහනාති නිලධාරී සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී (02) සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
සංවර්ධන නිලධාරී I/II/III ශ්‍රේණිය
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණිය
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
කළමනාකරණ සේවා නිලධාරී (I/II/III ශ්‍රේණිය)
ලියුන්දෑ කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක
විෂය නිලධාරීන්
1. සාමාන්‍ය පරිපාලනය
2. කාර්ය මණ්ඩල ප්‍රශ්නයාවූ සම්ප්‍රේරණ කිරීම හා ආයතන කටයුතු
3. දෙපාර්තමේන්තුවේ ප්‍රාහාන කටයුතු
4. ප්‍රහසාධන කටයුතු
5. කාර්ය මණ්ඩල සංවර්ධනය
6. අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය
විෂය නිලධාරීන්
1. ව්‍යාමික ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
2. මාසික, කාර්තුමය , වාර්ෂික ප්‍රගතිය සකස් කිරීම
3. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය නිලධාරීන්ගේ ප්‍රගතිය ඇගයීම
4. පාර්ලිමේන්තුවේ අයවැය සඳහා ඉදිරිපත් කරන වාර්තාවට අදාළ කරුණු දෙපාර්තමේන්තුවේ අංශ සම්බන්ධීකරණයෙන් ඉදිරිපත් කිරීම.
5. නව වාහනාති යෝජනා ඉදිරිපත් කිරීම
6. වැඩසටහන් සැලසුම් කිරීම
7. වාර්ෂික කාර්යසාධන වාර්තාව සම්පාදනය
විෂය නිලධාරීන්
1 පරිපාලන හා සම්බන්ධීකරණ හා සිද්ධි අධ්‍යයනය කාර්ය බද්ධ අධ්‍යයනය සම්බන්ධීකරණය
2. පරිපාලන හා සම්බන්ධීකරණ හා සිද්ධි අධ්‍යයනය කාර්ය බද්ධ අධ්‍යයනය සඳහා සියලුම පාර්ශවකරුවන් සමග සම්බන්ධීකරණය
3. ප්‍රතිපත්ති විග්ලේෂණය හා වාර්තා සකස් කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
4. ග්‍රාම වෙළඳපොළ නොතේරුණු, වාර්තා හා නොතේරුණු ප්‍රකාශන අධ්‍යක්ෂයාගේ අදාළව ඉදිරිපත් කිරීම
5. සම්මේලන , සම්මන්ත්‍රණ , වැඩමුළු , සංවිධාන කර පැවැත්වීම.
6. ආංශික ග්‍රාම වෙළඳපොළ නැමියාවන් ප්‍රගෝකරනය හා ග්‍රාම වෙළඳපොළ සැලසුම් කිරීම.
විෂය නිලධාරීන්
1. මිනිස්බල සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සියලම පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කිරීම.
2. ප්‍රගති සමාලෝචනය හා වාර්තා කිරීම
විෂය නිලධාරීන්
1. දෙපාර්තමේන්තුව සහ විදේශ රාජ්‍ය ආයතන දෙප-ාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් සම්බන්ධීකරණය සඳහා සම්බන්ධීකරණ කටයුතු
2. කොරියානු, ILO , WAPES , YOU LEAD වාහනති
3. අනෙක් ආයතන සම්බන්ධ විදේශ වාහනති.
විෂය නිලධාරීන්
රැකියා සම්පත් වැඩසටහන හා නිදහස් රැකියා සඳහා වෙළඹුමේ වැඩසටහන
2. වවෙසාගකත්ව සංවර්ධන ප්‍රහුණු වැඩසටහන
3. අවසානා ඔන ප්‍රහුණු හා ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන
4. රාජ්‍ය සේවය , පෞද්ගලික අංශය හා කුඩා හා මධ්‍ය පරිමාණ වාහාපෘ
5. විදේශ රැකියා ප්‍රවර්ධනය
විෂය නිලධාරීන්
1. වෘත්තීය මාර්ගෝප-දේශනය අත්පොත් හා මනෝමිතික පරීක්ෂණ යාවත්කාලීනව පවත්වා ගැනීම.
2. හසර B සහනාධාර සකස් කිරීම.
3. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය.
4. වෘත්තීය මාර්ගෝප-දේශන අත්පොත් හා මනෝමිතික පරීක්ෂණ යාවත්කාලීනව පවත්වා ගැනීම.
විෂය නිලධාරීන්
1. අමාත්‍යාංශ වැඩසටහන් සහ දිස්ත්‍රික් සඳහා වැඩසටහන් වලට අදාළව ප්‍රතිපාදන ගොඩ කිරීම.
2. රැකියා සේවා සපයන ආයතන, රැකියා අවේක්ෂිකයින්, අධ්‍යාපනයට උත්තු / අධ්‍යාපන රැකියාගත කිරීම, වෙනත් ආයතන වලින් රැකියාගත කිරීම විමුදිකළ ගොඩ කරන ලිපි සම්බන්ධීක-රණය
3. රැකියා පොළ වැඩසටහන
විෂය නිලධාරීන්
1. දෙපාර්තමේන්තුවේ ඉලක්ක කළමනාකරණ කටයුතු
2. ගබඩා සේවය
3. භාණ්ඩ හා සේවා සැපයුම්
විෂය නිලධාරීන්
1. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු

1.4. කාර්යමණ්ඩලතොරතුරු

ස්ථානමාරු ලැබ දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වූ මාණ්ඩලික නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	සේවයට පැමිණි දිනය
1	බී.එච්.සී.ශිරෝමාලි මිය	අධ්‍යක්ෂ(මානව සම්පත් කළමනාකරණ හා විදේශ කටයුතු)	2021.01.18
2	එස්.එන්.මායාදූන්නේ මිය	සහකාර අධ්‍යක්ෂ	2021.02.01
3	එම්.කේ.එස්.ජයසේන මිය	අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ)	2021.02.16
4	බී.එස්.එන්.පෙරේරා මයා	අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ)	2021.07.05
5	ඒ.එස්.ආර්.බණ්ඩාර මයා	සහකාර අධ්‍යක්ෂ (පාලන)	2021.08.02
6	ඒ.ඩී.එල්.කේ.ප්‍රියවංශ මයා	සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශ)	2021.08.10
7	ආර්.ජේ.අබේරත්න මිය	ගණකාධිකාරී	2021.09.21

ස්ථානමාරු ලැබ දෙපාර්තමේන්තුවෙන් බැහැර වූ මාණ්ඩලික නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	ස්ථාන මාරු ලැබූ දිනය
1	එච්.ජී.කේ.දීපශිකා මිය	සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශ)	2021.08.06

➢ **අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු 2021.12.31**

අනු අංකය	තනතුර	අදාළ වන සේවය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
1	අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ල.ප.සේ(විශේෂ)	1	1	0
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී.ල.ප.සේ(විශේෂ)	1	0	1
3	අධ්‍යක්ෂ (පාලන)	ශ්‍රී.ලං.ප.සේ I	1	1	0
4	අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ)	ශ්‍රී.ලං.ප.සේ I	1	1	0
5	අධ්‍යක්ෂ (සැලසුම් හාපර්යේෂණ)	ශ්‍රී.ලං.ක්‍ර.සේ I	1	1	0
6	අධ්‍යක්ෂ(මානව සම්පත් කළමනාකරණ හා විදේශ කටයුතු)	ශ්‍රී.ලං.ප.සේ I	1	1	0
7	අධ්‍යක්ෂ(මහජන රැකියා සේවය)	ශ්‍රී.ලං.ප.සේ I	1	0	1
8	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ I	1	1	0
9	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ II/III	1	1	0
10	අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේII/III	1	0	1
11	ස.අධ්‍යක්ෂ (පාලන)	ශ්‍රී.ලං.ප.සේ II/III	2	1	1
12	ස. අධ්‍යක්ෂ (සැලසුම් හා ප්‍රගති මෙහෙයුම්)	ශ්‍රී.ලං.ක්‍ර.සේII/III	1	1	0
13	ස.අධ්‍යක්ෂ (ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ)	ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III	1	1	0
14	ස.අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ, ප්‍රවර්ධන) සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශ)	ශ්‍රී.ලං.ප.සේ II/III	2	2	0
15	ස.අධ්‍යක්ෂ(ජාතික මානව සම්පත් හා රැකිරක්ෂා ප්‍රතිපත්ති)	ශ්‍රී.ලං.ප.සේ II/III	1	1	0
16	ස.අධ්‍යක්ෂ(විදේශ කටයුතු)	ශ්‍රී.ලං.ප.සේ II/III	1	1	0
17	ස.අධ්‍යක්ෂ(මහජන රැකියා සේවය)	ශ්‍රී.ලං.ප.සේ II/III	1	0	1
18	නීති නිලධාරී	දෙපාර්තමේන්තු ගත	1	0	1
19	පරිපාලන නිලධාරී	රා.කළ.සේ.අධි	1	0	1
20	භාෂා පරිවර්තක	භාෂා පරිවර්තක සේවය I/II	2	0	2
21	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රීලං.තො.ස.තා.සේII/III	1	0	1
22	සංඛ්‍යා ලේඛන නිලධාරී	ක්ෂේත්‍රගත/කාර්යාලගතII/III	1	0	1
23	වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් *	දෙපාර්තමේන්තුගත	85	28	0
24	ව්‍යාපෘති නිලධාරීන්	ආශ්‍රිත සේවය	3	3	0
25	මානව සම්පත් සංවර්ධන සහකාර	ආශ්‍රිත සේවය	560	534	26
26	රාජ්‍ය කළමනාකරණ සහකාර	රා.කළ.සේ I/II/II	35	23	12
27	රියදුරු	රියදුරු සේවය	8	4	4
28	කාර්යාල කාර්ය සහයක	කාර්යාල සේවාසේවය II/III	7	6	1
	එකතුව		**723**	**612**	**112**

*උක්තවෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී තනතුරු අදාළ නිලධාරීන්ට සුවිශේෂී වනසේ ලබාදී ඇති තනතුරු වේ.එබැවින් දැනට සේවය කරනු ලබනනිලධාරීන්විශ්‍රාම යාමෙන් පසුව එම තනතුර අහෝසි වේ. එමනිසා පුරප්පාඩු නොමැති සේ සලකා සටහන් යොදා ඇත.

1.5.දෙපාර්තමේන්තුවේ අංශ

“ සෞභාග්‍යයේ දැක්ම” වැඩපිළිවල යටතේ ප්‍රමුඛතාවයක් ලබා දී තිබෙන ස්මාර්ට් ශ්‍රී ලංකා ආයතනය තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේMOYS/YAD/07/03/01 හා 2020.12.11දිනැති ලිපිය අනුව මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරීමත් සමඟ එහි අරමුණු සපුරා ගැනීම සඳහා එතෙක් පැවති ආයතනික ව්‍යුහය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ප්‍රතිසංවිධානය කිරීම සඳහා කටයුතු කරන ලදී.

ඒ අනුව, මින් පෙර පැවති,

- පාලන අංශය
- ගිණුම්අංශය
- වෘත්තීය මාර්ගෝපදේශ හා රැකියා නිර්මාණ ප්‍රවර්ධන අංශය
- මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය

යන අංශ හතරකින් සමන්විත ආයතනික ව්‍යුහය, එක් එක් කාර්යයන් සඳහා සුවිශේෂී අංශ හා ඒකක වලින් සමන්විතවන පරිදි පහත සඳහන් ලෙස ස්ථාපනය කිරීමට කටයුතු කර ඇත.

- පාලන අංශය
- ගිණුම් අංශය
- සැළසුම් හා පර්යේෂණ අංශය
- රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය
- මානව සම්පත් කළමනාකරණ හා ජාත්‍යන්තර සබඳතා අංශය
- මහජන රැකියා සේවා අංශය
- ජාතික වෘත්තීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය
- අභ්‍යන්තර විගණන අංශය

දෙපාර්තමේන්තුවේ අංශ

අනු අංකය	අංශය	හැඳින්වීම
01	පාලන අංශය	දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටුකිරීම උදෙසා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට දායක වීම තුලින් විශිෂ්ඨ කාර්යසාධනයක් ළඟා කරගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරිත්වයට සහාය වීම පිණිස ආයතන කටයුතු හා සාමාන්‍ය පරිපාලන කටයුතු මෙහෙයවීම, ඇගයීම හා නංවාලීම සිදු කරයි.
02	ගිණුම් අංශය	දෙපාර්තමේන්තුවේ මුල්‍ය පරිපාලනමය කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලබන අතර 2021වර්ෂයේදී රු.මි.468ක් මෙහෙයුම් කළ අතර වැටුප් හා වේතන ගෙවීම, සමස්ත මූල්‍ය ප්‍රවාහය කළමනාකරණය, ගබඩා කළමනාකරණය හා විගණන නිලධාරීන් වෙත තොරතුරු සැපයීම සිදු කරයි.
03	සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය	දෙපාර්තමේන්තුවේ විවිධ සැළසුම් සකස් කිරීම, දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය මට්ටමේ සේවයේ යෙදෙන මානව සම්පත් සංවර්ධන නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලය අතර සබඳතාවය පවත්වා ගැනීමත් එම නිලධාරීන්ගේ භෞතික හා මුල්‍ය ප්‍රගතිය ලබා ගැනීම, විශ්ලේෂණය, ප්‍රගති වාර්තා සකස් කිරීම හා අවශ්‍ය පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීම මගින් දෙපාර්තමේන්තුවේ කළමනාකරණයට සහය වීම සිදු කරයි.
04	ශ්‍රම වෙළඳපොළ තොරතුරු හාපර්යේෂණ ඒකකය	ජාතික ශ්‍රම වෙළඳපොල පිළිබඳ කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීම සඳහාත්, ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන් ,පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයින් සඳහාත් අවශ්‍ය ශ්‍රම වෙළඳපොළ තොරතුරු භාවිතයට පහසු වන ආකාරයෙන් සියළු පාර්ශවකරුවන් වෙත තොරතුරු සම්පාදනය සිදුකරනු ලැබේ
05	රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය	වෘත්තීය මාර්ගෝපදේශ සේවාලාභීන්ගේ වෘත්තීය වරණය හා වෘත්තීය සංවර්ධනය සඳහා නිවැරදි වෘත්තීය මාර්ගෝපදේශ සේවාවන් ලබා දෙමින් ශ්‍රම බලකාය නිපුණ හා ගෝලීය ශ්‍රම වෙළඳපොලට ගැලපෙන ආකාරයෙන් ගොඩනැගීමට දායකත්වය ලබා දීම සිදු කරයි.
06	මානව සම්පත් කළමනාකරණ හා ජාත්‍යන්තර සබඳතා අංශය	මේ යටතේ අංශ තුනක් ක්‍රියාත්මක වේ.
	1.මානව සම්පත් කළමනාකරණ අංශය	මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්ති මෙරට තුළ ක්‍රියාත්මක කරවීමට හා අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීමට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව වෙත අවශ්‍ය බලපෑම් සිදු කිරීම හා සහය ලබාදීම.
	2.ජාත්‍යන්තර සබඳතා අංශය	දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළව ජාත්‍යන්තර ආයතන විසින් මෙරට ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සම්බන්ධීකරණ කිරීම සිදු කරයි.
	3. තොරතුරු තාක්ෂණ අංය	දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත අවශ්‍ය පහසුකම්,දැනුම ලබාදීම හා දෙපාර්තමේන්තුවේ ප්‍රචාරණ කටයුතු මෙහෙයවීම සිදු කරයි.
07	මහජන රැකියා සේවා අංශය	ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය සඳහා පුද්ගලික අංශයේ ඵලදායී රැකියා අවස්ථාවන් කාර්යක්ෂම ලෙස ලබාදීම අරමුණු කරගෙන මහජන රැකියා සේවා මධ්‍යස්ථානදිස්ත්‍රික්ක 25 ස්ථාපිත කර කළමනාකරණය සිදු කිරයි.

1.6. දෙපාර්තමේන්තුවේ අංශයන්හි කාර්යභාරය

අනු අංකය	අංශය	කාර්යභාරය
01	පාලන අංශය	1.නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම 2.පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම 3.ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම 4.දෛනික තැපෑල 5. බඳවා ගැනීම්, විනය පාලනය,දෙපාර්තමේන්තුමෙහෙයුම්පරිපාලන කටයුතු 6. ප්‍රවාහන කටයුතු
02	ගිණුම් අංශය	1. වැටුප් හා වේතන ගෙවීම 2.සමස්ත මූල්‍ය ප්‍රවාහය කළමනාකරණය 3. ගබඩාකරණය 4.විගණන නිලධාරීන් වෙත තොරතුරු සැපයීම
03	සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය	1. දෙපාර්තමේන්තුවේ සියළුම අංශ සහභාගි කර ගනිමින් උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම. 2. දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික සැලැස්මට අනුකූලව සියළුම අංශ සහභාගී කරගනිමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඊට අනුකූලව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර සිටින නිලධාරීන් සඳහා වාර්ෂික ඉලක්ක ලබා දීම. 3. ව්‍යාපෘති යෝජනා සකස් කිරීම හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම 4. දෙපාර්තමේන්තුවේ මාසික මය හා වාර්ෂිකකාර්තු ,ප්‍රගති වාර්තා සකස් කිරීම 5. වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා යොමු කිරීම 6. වාර්ෂිකව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමට අනුයුක්ත කර සිටින දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇගයීම 7. පහත සඳහන් රැස්වීම් පැවැත්වීම රැස්වීම් සඳහා ,සහභාගි වීම , වාර්තා සකස් කිරීම හා එම තොරතුරු බෙදා හැරීම • දෙසති රැස්වීම්මාණ්ඩලික නිලධාරීන්ගේ - සහභාගිත්වයෙන් • දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ රැස්වීම් • අර්ධ වාර්ෂික හා වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් • දිස්ත්‍රික් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම • අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම • අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම • කලමණාකරණ විගණන කමිටු රැස්වීම • කලමණාකරණ විගණන කමිටු රැස්වීම -අමාත්‍යාංශය 8. දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර සිටින දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
04	ශ්‍රම වෙළඳපොළ තොරතුරු හාපර්යේෂණ ඒකකය	1. අධ්‍යයන වාර්තා සකස් කිරීම 2.පාර්ශවකාර ආයතන සමඟ විවිධ සංවාදශීලීවැඩසටහන් ක්‍රියාත්මක කිරීම 3. ශ්‍රම වෙළඳපොළ අධ්‍යයන වාර්තා සකස් කිරීම 4. මාසික පුවත්පත් සඟරා සකස් කිරීම

		5. ශ්‍රම වෙළඳපොළ තොරතුරු සමාජගත කිරීම 6. සමාජ ආර්ථික දත්ත අත්පොත සකස් කිරීම
05	රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය	1. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන පැවැත්වීම 2. දිස්ත්‍රික් රැකියා පොළ හා දිස්ත්‍රික් වෘත්තීය පොළ පැවැත්වීම 3. පෞද්ගලික අංශයේ රැකියාගත කිරීම් සිදු කිරීම 4. පාසල් සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම 5. වෘත්තීය මාර්ගෝපදේශ අත්පොත් යාවත්කාලීන කිරීම 6. හසර සහරාව සකස් කිරීම 7. වෘත්තීය මාර්ගෝපදේශ සේවා ලබාදීම
06	මානව සම්පත් කළමනාකරණ අංශය	1. මානව සම්පත් රැකියා ප්‍රතිපත්තිය යටතේ එක් එක් ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයට සම්බන්ධ අදාල ආයතන වෙත නිර්දේෂ හා යෝජනා ඉදිරිපත් කිරීම. 2. ශ්‍රී ලංකාවේ මානව සම්පත් කළමනාකරණය හා ඵලදායී භාවිතය පිළිබඳ නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම
07	ජාත්‍යන්තර සබඳතා අංශය	1. ගෝලීය වශයෙන් පවතින රැකියා වෙළඳපොළ හා අනාගත රැකියා අවස්ථා පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම. 2. විදේශ රැකියා අවස්ථා පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම හා අවශ්‍ය පූහුණු අවස්ථා සම්බන්ධීකරණය
08	තොරතුරු තාක්ෂණ අංශය	1. මාර්ගගත රැස්වීම් සඳහා පහසුකම් සැලසීම 2. දෙපාර්තමේන්තු අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධති සකස් කිරීම හා අධීක්ෂණය 3. දෙපාර්තමේන්තු කටයුතු ඩිජිටල්කරණය කිරීමට අදාල නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 4. දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හා ඊට අනුබද්ධ රැකියා අපේක්ෂිතයන් හා රැකියා සපයන ආයතන ලියාපදිංචි වන Job Portal කළමනාකරණය කිරීම 5. රැකියා අපේක්ෂිත තොරතුරු ඇතුළත් මාර්ගගත දත්ත පද්ධතියකළමනාකරණය 6. දෙපාර්තමේන්තුව සතුව පවතින සමාජ මාධ්‍ය ජාලා හා FB, YouTube, Twitter,inkedin, TikTok පවත්වාගෙන යාම 7. මාර්ගගතව දෙපාර්තමේන්තුවට යොමුවන ගැටළු සඳහා පිළිතුරු සැපයීම අඛණ්ඩව සිදු කරනු ලබයි
09	මහජන රැකියා සේවය	1. රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම 2. පුද්ගලික අංශයේ ආයතන ලියාපදිංචි කරගැනීම 3. රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් අනුව රැකියා ගැළපීම්සිදුකිරීම හා සම්මුඛ පරීක්ෂණ සඳහා යොමුකිරීම 4. රැකියාගත කිරීම් හා පසුවිපරම් කිරීම 5. වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් සැපයීම 6. රැකියා පුරප්පාඩු පිළිබඳ රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීම 7. පුහුණුව සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම 8. රැකියා තත්ත්වයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන රැස්කිරීම් හා ප්‍රකාශයට පත් කිරීම 9. විදේශීය රැකියා අවස්ථා සඳහා මහපෙන්වීම 10. දිස්ත්‍රික් රැකියාපොළ වැඩසටහන සංවිධානය කර පැවැත්වීම

02

පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- ප්‍රාග්ධන වැය විෂයය යටතේ වන සංවර්ධන වැඩසටහන්ප්‍රගතිය 2021.12.31 දිනට

වැඩසටහනේ නම	වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	2021.08.31 දිනට සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.)	2021 12.31. දිනට මුල්‍ය ප්‍රගතිය	මුල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
රැකියා පියස වැඩසටහන)Jobs Net Programe) 328 -1-1-2-2509	3	2.5	1.348	54%	60%
ශ්‍රම වෙළඳපොල ඉල්ලුම ඉලක්ක කර ගනිමින් රැකියා කුසලතා සහිත මානව සම්පත් සංවර්ධනය 328 -1-1-6-2509	7	5	4.692	93%	154%
ශ්‍රම වෙළඳපොල තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම 328 -1-1-8-2509	20	2	1.945	97%	65%
ව්‍යාත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 328 -1-1-9-2509	6.5	6.5	5.925	91%	128%
මහජන රැකියා සේවය ස්ථාපනය කිරීම 328 -1-1-11-2509	5.5	3.5	1.332	38%	78%
ශ්‍රම වෙළඳපොල තොරතුරු සඳහා කලමණාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම 328 -1-1-12-2509	5	2	2.000	100%	35%
ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ආබාධ සහිත පුද්ගලයින් ආර්ථික අංශයට ඇතුළත් කර ගැනීම සඳහා රැකියා ගත කිරීම හා ස්වයං රැකියා සඳහා මඟ පෙන්වීම සඳහා වූ ලෝක කම්කරු සංවිධාන ව්‍යාපෘතිය 328-1-1-14-2509	2.299	2.299	1.777	77%	100%
ස්මාර්ට් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය 194-1-10-2-2509	135.233	135.233	83.582	61%	79%
එකතුව	184.532	159.032	102.601	76.375%	87.375%

- 2021.12.31දිනට ලභා කර ගත් ඉලක්ක

	වැඩසටහන/ ක්‍රියාකාරකම	2021/01/01 දින සිට 2021/12/31 ප්‍රගතිය		ප්‍රතිලාභීන් ගණන
		භෞතික	මුල්‍ය (රු.මි)	
1	**ඉලක්කගත ප්‍රතිලාභීන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සේවාවන් ලබා දීම (සැසි ගණන)**			
	අ.පො.ස සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන	1682	5.925	56,156
	අ.පො.ස උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන	553		20,131
	ස්වයංරැකියා පෙළඹවීම් වැඩසටහන	331		10,043
	වෘත්තීයඅභියෝග ජය ගැනීම සඳහා වූ වැඩසටහන	148		4,980
	උපාධි අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශවැඩසටහන අභ්‍යන්තර /බාහිර	19		1,411
	ගුරුවරුන්දැනුවත් කිරීමේ වැඩසටහන	149		7,017
	දෙමාපියන්දැනුවත් කිරීමේ වැඩසටහන	435		20,075
2	වෘත්තීය මාර්ගෝපදේශප්‍රතිලාභී අත්පොත්සංශෝධනය	100%		-
3	ව්‍යවසායකත්වසංවර්ධන වැඩසටහන	109	4.692	2,678
4	ප්‍රාදේශීයරැකියා පොළ වැඩසටහන	113		16,236
	වෘත්තීය මාර්ගෝපදේශ සේවාලබාදුන් මුළු ප්‍රතිලාභීන්			**138,709**
5	**ශ්‍රම වෙළඳපොළ අධ්‍යයනයන් හා ප්‍රකාශන**			
	අධ්‍යයන වාර්තා (Study Reports)	07	0.172	
	සමාජ ආර්ථික දත්ත අත්පොත (Socio- Economic Data Book)වෙබ් අඩවියේ පළ කිරීම	100%	0.015	
	ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඇතුළත් CD තැටි සකස් කිරීම - වෙබ් අඩවියේ පළ කිරීම	100%	-	
6	වෘත්තීය මාර්ගෝපදේශ සතිය ක්‍රියාත්මක කිරීම	100%	10.600	
7	වීඩියෝ පට සැකසීම (පාසල් සිසුන් සඳහා)	11		
8	රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම	70,124	-	70,124
	රැකියාඇබෑර්තු ලියාපදිංචි කිරීම	26,281		26,281
	රැකියා ගතකිරීම	7,759		7,759
9	දිස්ත්‍රික්රැකියා පොළ හා ජාතික රැකියා පොළ(මාර්ගගත)	14	-	3,737

- **2021.12.31 දිනට රැකියා ගත කිරීම්**

	දිස්ත්‍රික්කය	සෘජු රැකියා ගත කිරීම්		ස්වයං රැකියාලාභීන්/ව්‍යවසායකයින් බිහි කිරීම
		දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන මගින්	ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින්	
1	කොළඹ	388	134	18
2	ගම්පහ	71	206	-
3	කළුතර	93	553	67
4	මහනුවර	229	508	54
5	මාතලේ	82	180	7
6	නුවරඑළිය	81	505	20
7	ගාල්ල	12	214	19
8	මාතර	83	89	28
9	හම්බන්තොට	125	242	16
10	යාපනය	286	157	24
11	මන්නාරම	216	33	145
12	වවුනියාව	151	-	66
13	මුලතිව්	0	-	-
14	කිලිනොච්චිය	33	-	-
15	මඩකලපුව	63	41	33
16	අම්පාර	4	71	18
17	ත්‍රිකුණාමලය	17	10	101
18	කුරුණෑගල	183	580	32
19	පුත්තලම	32	82	-
20	අනුරාධපුරය	77	30	-
21	පොළොන්නරුව	31	36	7
22	බදුල්ල	189	556	6
23	මොණරාගල	1	69	13
24	රත්නපුර	30	569	26
25	කෑගල්ල	35	382	7
		2,512	**5,247**	
	මුළු එකතුව	**7,759**		**707**

- **Life Talk විශේෂ වැඩසටහන**

වෘත්තීය මාර්ගෝපදේශ සතිය තුළ ක්‍රියාත්මක වූ වැඩසටහන් අතර තවත් එක් සුවිශේෂී වැඩසටහනක් වූයේ Life talk" දේශන මාලාවයි. දිවයින තුළ පැවති "Covid – 19" වසංගත තත්ත්වය තුල සාමාන්‍ය ජනතාවගේ රැකියා සුරක්ෂිත බව අවම වූ අතර විරැකියා ප්‍රතිශතය ක්‍රමයෙන් ඉහළ යන බවට අනාවැකි පළ විය. මෙම වටපිටාව තුළ වෘත්තීය මාර්ගෝපදේශයේ වැදගත්කම අප මනාව නිරීක්ෂණය කළෙමු. ඒ අනුව තෝරාගත් ප්‍රතිලාභීන් කාණ්ඩ සඳහා (9 ශ්‍රේණිය, අ.පො.ස.(සා.පෙළ)හා අ.පො.ස.(උ.පෙළ), ගුරුවරු, දෙමව්පියන්) මාර්ගගත දේශන මාලාවක් අගෝස්තු මාසය තුළ ක්‍රියාත්මක කරන ලදි.

දින 17ක් පුරා අඛණ්ඩව පැවති මෙම දේශනමාලාව හරහා සිංහල හා දමිළ මාධ්‍ය දරුවන් 21,000 ට අධික පිරිසක් දැනුවත් කිරීමට අපට හැකි වී තිබිණ. වෘත්තීය මාර්ගෝපදේශ සතිය වැඩසටහන තුළදී ප්‍රජාව දැනුම්වත් කිරීමේ ක්‍රියාදාමය යටතේ ඔක්.04 සිට ඔක්.09 දින ප.ව.6.00 සිට 7.00 දක්වා මාර්ගගත ක්‍රමය ඔස්සේ දේශන/ webinar පැවැත්වීමට කටයුතු කරන ලදී. එහිදී වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳව රාජ්‍ය අංශය, ජාත්‍යන්තර ආයතන,පෞද්ගලික ආයතන, විශ්ව විද්‍යාල නියෝජනය කරමින් සම්පත් දායකයින් තම දැනුම ලබා දීමට කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකාවේ පවතින සමාජ, ආර්ථික ගැටළු හමුවේ පීඩාවට පත්ව සිටින ජන කොට්ඨාශ සඳහා ප්‍රබල මැදිහත්වීමක අවශ්‍යතාවයේ හිඩැස පිරවීම වෙනුවෙන් සංවාදාත්මක හා බුද්ධිමය සංවාදයක් මාර්ගගතව පැවැත්වීම මෙම වැඩසටහනෙහි අරමුණ විය. ඒ අනුව දිවයිනමඅාවරණයවනපරිදිZoom තාක්ෂණය ඔස්සේ, දෙපාර්තමේන්තුවේ FB page හා YouTube channel (inspired Career) හරහා මෙය ක්‍රියාත්මක විය.

විශේෂ වැඩසටහන්	දිනය හා වේලාව	වැඩසටහනේ නම	වැඩසටහන් ගණන
Life Talk වැඩසටහන	ජූලි 1- 29 බ්‍රහස්පතින්දා දක්වා සවස 5.00-6.00	ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	4
Life Talk වැඩසටහන	අගෝස්තු 02 සිට අගෝස්තු 21 දක්වා (සඳුදා, බදාදා, බ්‍රහස්පතින්දා, සෙනසුරාදා දිනවල	උසස් පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන සඳුදා සවස 6.30 – දක්වා 7.30	15
		සාමාන්‍ය පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන බ්‍රහස්පතින්දා සවස දක්වා 7.30 – 6.30	
		වසර සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන 9 බදාදා සවස දක්වා 6.00 – 5.00	
		ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් බ්‍රහස්පතින්දා සවස දක්වා 6.00 – 5.00	
		දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන සෙනසුරාදා රාත්‍රී දක්වා 9.00 – 8.00	
Life Talk වැඩසටහන - වෘත්තීය මාර්ගෝපදේශ සතියට සමගාමීව පැවැත්වූ වැඩසටහන්	සැප්තැම්බර් 14 සිට 30 දක්වා සෑම දිනකම සවස 6 සිට 7 දක්වා සිංහල මාධ්‍යය රාත්‍රී 7.30 – 8.30 දක්වා දෙමළ මාධ්‍යය	වෘත්තීය මාර්ගෝපදේශය හැඳින්වීම හා එහි වැදගත්කම	සිංහල මාධ්‍ය 17 දෙමළ මාධ්‍ය 17
		මනෝමිතික පරීක්ෂණ හා න්‍යාය	
		පෞරුෂය හා ඔබ	
		මෘදු කුසලතා	
		වැඩ ලෝකය හැඩ කරමු	
		සිහින දකිමු සැලසුම් කරමු	
		උසස් අධ්‍යාපනය හා වෘත්තීය පුහුණු පාඨමාලා	
		තීරණ ගැනීම	
		රටේ සංවර්ධනයට තරුණ ප්‍රජාවගේ දායකත්වය	

විශේෂ වැඩසටහන්	දිනය හා වේලාව	වැඩසටහනේ නම	වැඩසටහන් ගණන
		අයදුම්පත් සැකසීම හා සම්මුඛ පරීක්ෂණ සඳහා මුහුණ දීම	
		සාර්ථක ව්‍යවසායකයකු වන්නේ කෙසේද	
		අලවිකරණයේ වැදගත්කම	
		සාර්ථකත්වයේ දිනුම් සාධක 7 Habits	
		ශ්‍රම ඵලදායිතාවය හා ශ්‍රී ලංකාවේ ආර්ථිකය	
		සිතීම හා නිර්මාණශීලීව සිතීම	
		මතක තබා ගැනීමේ කාල කලමණාකරණය	
		නව තාක්ෂණය හා තාරුණ්‍ය	
වෘත්තීය මාර්ගෝපදේශ සතියේ පවත්වන ලද විශේෂිත ආරාධිත දේශන	2021.10.04 දින සිට 2021.10.09 දක්වා	1.international experience on the job market and work force Mrs. Thilaka Jayasundara	6
		2.New Job Market trends arise with the Covid 19 pandemic Situation Mr. Erandika Dissanayake	
		3.Cultural Barriers associated with Entrepreneurship Dr. M.T. M Maheesh	
		4.Entreprenurship and Labour Market Prof. S. Santhirasekaram	
		5. Think unique and Enligten your Career Dr. Kishu Gomes	
		6. Stories of Successful Entrepreneurs Mr. Ponnaiah Nallarathnam Mr. T Mayooran	
Life Talk වැඩසටහන - 2021 දෙසැම්බර් මාසය තුල පවත්වන ලද වැඩසටහන්	දෙසැම්බර් 01 සිට සෑම දිනකම සවස 06 -07	සොඳුරු විල පෙර පාසල් ගුරුවරුන් දැනුවත් - කිරීමේ වැඩසටහන සඳුදා සවස 6 -7	4
		සොඳුරු පියස නව විවාහක යුවල හා ගැබිනි කාන්තාවන් සඳහා වැඩසටහන	4
		සෙනෙහසේ පියස -දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන	5
		අභිමානයේ දෝංකාරය ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන	5
		පියාපත් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන	3
		බුද්ධි මණ්ඩපය දැනුවත් කිරීමේ නිලධාරීන් වැඩසටහන	2
		ක්ෂේමභූමි ව්‍යවසායකයන් හා නව රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන	3
Life Talk වැඩසටහන් ගණන =85 මුළු ප්‍රතිලාභීන් ගණන=89,750			

2021 වර්ෂය තුළ මුල්‍ය ප්‍රතිපාදන නොමැතිව සිදු කරන ලද වැඩසටහන් සඳහා ගණනය කළ මූල්‍යමය වටිනාකම් පැවරීම

අනු අංකය	වැඩසටහන	මූල්‍ය ප්‍රතිපාදන යටතේ වැඩසටහන සිදුකලේ නම් එක් ප්‍රතිලාභියෙකු සඳහා වියදම (A)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (B)	ගණනය කළ මූල්‍යමය අගය (A)* (B)
01	අ.පො.ස.සා.පෙළ වැඩටහන (මාර්ගගත)	100.00	56,156	5,615,600.00
02	අ.පො.ස.උ.පෙළ වැඩටහන (මාර්ගගත)	100.00	20,131	2,013,100.00
03	උපාධිධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන(මාර්ගගත)	100.00	939	93,900.00
04	ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන (මාර්ගගත)	100.00	6,723	672,300.00
05	දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන(මාර්ගගත)	100.00	9,679	967,900.00
06	වෘත්තීය අභියෝග ජයගැනීමේ වැඩසටහන(මාර්ගගත)	100.00	1,984	198,400.00
07	ස්වයං රැකියා පෙළඹවීමේ වැඩසටහන(මාර්ගගත)	100.00	1,113	111,300.00
08	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන(මාර්ගගත)	100.00	1,776	177,600.00
09	රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන(මාර්ගගත)	100.00	8,613	861,300.00
10	ප්‍රාදේශීය රැකියා පොළ(මාර්ගගත)	100.00	680	68,000.00
11	විශේෂ වැඩසටහන්	100.00	61,703	6,170,300.00
12	Life Talk	100.00	89,750	8,975,000.00
මුළු එකතුව				**25,924,700.00**

2.1. ආංශික ප්‍රගතිය

2.1.1. ශ්‍රම වෙළඳපොළ තොරතුරු අංශය - 2021 වර්ෂයේ ප්‍රගතිය

අනු අංකය	යෝජිත වූ කාර්යයන්	කළ වැඩසටහන් ප්‍රගතිය	මූල්‍ය සාරාංශය රු):)	
			වෙන් කළ මුදල	වැය කළ මුදල
01	අධ්‍යයන වාර්තා (Study Report)	වාර්තා 7ක් සකස් කර අවසන් කර ඇත.	172,000	172,000
02	ශ්‍රම වෙළඳපොළ අධ්‍යයන වාර්තා (Sectorial Studies) කෘෂි කර්මාන්ත අංශය	මූලික සංකල්ප පත්‍රිකාව සකස් කර ඇතනිර්ණාය සියල්ල ක සකස්කර ඇත. (TOR)	–	
	සෞඛ්‍යය අංශය		–	
	ආයුර්වේද ක්ෂේත්‍රය ආශ්‍රිත ඖෂධ පැළෑටි මඟින් රැකියා ජනිත කිරීම			
	ශ්‍රී ලංකාවට විදේශයෙන් පැමිණ සේවයේ නිරත වන ශ්‍රමිකයින් පිළිබඳ හැදෑරීම.		–	
03	සුසංවේද	තරුණයා සහ නිෂ්පාදන ආර්ථිකය ක්‍රීඩාව සහ ව්‍යවසායකත්වය කෘෂි පාරිසරික විද්‍යාව මානව සංවර්ධනය උදෙසා පාසල් අධ්‍යාපනය යන මාතෘකා යටතේ වාර්තා සකස් කර අවසන් කර ඇත.	203,785	203,785
04	ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඇතුළත් CD තැටි සකස් කිරීම LMI Data CD	ශ්‍රමවෙළඳපොළ තොරතුරු ඇතුළත් CD තැටි සකස් නොකළ අතර එම තොරතුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ලැබේ .	-	-
05	වාර්ෂික ශ්‍රම වෙළඳපොළ සඟරාව Annual LMI Bulletine	2022පළමු කාර්තුව තුළ නිකුත් කිරීමට නියමිතය.	-	-
06	සමාජ ආර්ථික දත්ත අත්පොත Socio- Economic Data Book	මෙය සිංහල දෙමළ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.	15610.00	15610.50
07	Training (GIS & SPSS)	GIS මෘදුකාංගය,SPSS මෘදුකාංගය පිළිබඳ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුහුණු කිරීම	1,000,000	826,807.80
	එකතුව		1,391,395	1,218,202

2.1.2. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය- 2021 වර්ෂයේ ප්‍රගතිය

අනු අංකය	2021 වර්ෂයට අදාළව සිදු කිරීමට යෝජිත කාර්යයන්	කළ වැඩසටහන් ප්‍රගතිය
01	ව්‍යවසායකත්ව අත්පොත සකස් කිරීම -සිංහල මාධ්‍ය	ව්‍යවසායකත්ව අත්පොත සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත උඩුගත කිරීම -සිංහල මාධ්‍ය
02	ව්‍යවසායකත්ව අත්පොත සකස් කිරීම -දෙමළ මාධ්‍ය	ව්‍යවසායකත්ව අත්පොත සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත උඩුගත කිරීම -දෙමළ මාධ්‍ය
03	2020 වර්ෂයේ අ.පො.ස.සා.පෙළසමත් නොවූ සිසුන් වෘත්තීය අධ්‍යාපන හා පුහුණුවීම් සඳහා යොමු කිරීමේ වැඩසටහන	අ.පො.ස.සා.පෙළ අසමත්ව අධ්‍යාපනය අවසන් කරන ලද දරුවන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම

- **වීඩියෝ පට සකස් කිරීම**

සාර්ථක ව්‍යවසායකයින්ගේ අත්දැකීම් පිළිබඳව වීඩියෝ පට 75 සකස් කරන ලද අතර අප දෙපාර්තමේන්තුවේ “Inspired Career” You tube නාලිකාව වෙත එම වීඩියෝ පට සෑම සතියකම සිකුරාදා දින උඩුගත කරන ලදී.

දෙපාර්තමේන්තුවේ රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය මගින් දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්, රට තුළ පවතින සෞඛ්‍ය අවධානම හේතුවෙන් විනාඩි 20 ක් බැගින් වූ වීඩියෝපට 54ක්පටිගත කර පිටපත් 130 ක් බැගින් සකස් කිරීමට කටයුතු කරන ලදී.

ඒ අනුව මෙම විඩියෝපට පහත සඳහන් ප්‍රධාන කරුණු හා මාතෘකා යටතේ සකස් කරන ලදී.

අනු අංකය	වැඩසටහන	මාධ්‍යය	මාතෘකා
01	අ.පො.ස.(උ.පෙළ) සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන	සිංහල	1. අභිමානවත් දේශයක උරුමකරුවන් වෙමු
			2. ඔබ අසිරිමත්
			3.උසස් අධ්‍යාපන අවස්ථා හා වෘත්තීය පුහුණු අවස්ථා
			4. වැඩලොව ගවේෂණය
			5. රැකියා ලොව නවප්‍රවණතා
			6. අභියෝග ජය ගනිමු
			7. අපි එකම සහ ස්ථාවර අරමුණක පිහිටමු
02.	උපාධි අපේක්ෂකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්	සිංහල	8. අභිමානවත් දේශයක් වෙනුවෙන්
			9. මෘදු කුසලතා

			10. නිර්මාණශීලීත්වය තුලින් නවෝත්පාදනයට වැඩලොවට නව පිම්මක්
			11. ඔබ අසිරිමත්
			12. වෘත්තිය තීරණගැනීමේකලාව
			13. දිනුවන් හඳුනාගනිමු, සැලසුම් තුළින් ජීවිත සාර්ථකත්වයට
			14. සාර්ථකත්වය සඳහා දිනුම් සාධක
03.	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	සිංහල	15. අලෙවිකරණසංකල්පය
			16. පාරිභෝගික සත්කාරය
			17. භාණ්ඩ සංවර්ධනය
			18. ගිණුම්කරණය හා ව්‍යාපාර සැලැස්ම
			19. අලෙවිකරණයේදී සලකා බැලිය යුතු සාධක
			20. වාසනාවන්තයින් බිහි කරන (Jolly Way)
			21. කෝපයේ ස්වභාවය
04.	වෘත්තිය සැලසුම් ජයගැනීමේ වැඩසටහන	සිංහල	22. සම්මුඛ පරීක්ෂණය
			23. ජීවිත සාර්ථකත්වය සඳහා අරමුණු
			24. වැඩ ලෝකය
			25. වෘත්තිය සැලසුම් ජයගැනීම
			26. 21 වන ශතවර්ෂයේ තාරුණ්‍යයේ කුසලතා
			27. ජීවදත්ත පත්‍රිකාව හා ආවරණ ලිපිය
			28. අපේ ජීවිත අපිම ගොඩනගමු
05.	ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන	සිංහල	29. වෘත්තීය මාර්ගෝපදේශනයේ වැදගත්කම හා අරමුණ
			30. ජීවිතය ජයගන්න මෘදුකුසලතා
			31.වෘත්තීයමාර්ගෝපදේශගුරුවරයාගේකාර්යභාරය
			32. වැඩලොවනවප්‍රවණතා
			33.කාර්යකළමනාකරණයතුළින්වෘත්තීයආතතිය පාලනයකරමු
			34.පාසල් දරුවන්ට හරි පාර පෙන්වන ගුරු භූමිකාව
			35.අධ්‍යාපනය සාර්ථක කර ගැනීමට පෞරුෂත්වයේ ඇති වැදගත්කම
			36. ජෝන් හොලන්ඩ් න්‍යාය ඇසුරෙන් වෘත්තීය යතුර මනෝමිතික පරීක්ෂණය අවබෝධ කර ගනිමු
			37. වෘත්තීය මාර්ගෝපදේශ ඇසුරෙන් වෘත්තීය තීරණගැනීම

			38. නිර්මාණශීලිත්වය හා ව්‍යවසායකත්වය
			39. අභිමානවත් දේශයක් කරා
06	ස්වයං රැකියා පෙළඹවීමේ වැඩසටහන	සිංහල	40. ස්වයං රැකියාවක් තෝරා ගත යුත්තේ ඇයි?
			41. ව්‍යවසායකත්ව අරමුණු පිහිටුවා ගැනීම
			42. ඔබට නියුක්ත විය හැකි ඵලදායී ස්වයංරැකියා අදහස් කිහිපයක්
			43. පුද්ගලික ව්‍යවසායක නිපුණතා
			44. ව්‍යාපාර අදහස් තෝරාගැනීමේ ක්‍රමවේදය
07	9 වන ශ්‍රේණියේ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන	සිංහල	45. 9 ශ්‍රේණියේ ඔබේ යොවුන් වියේ අභියෝග ජයගන්න, අධ්‍යාපන අභියෝග ජය ගනිමු
			46. අභිමානවත් දේශයක් කරා
			47. කාණ්ඩ විෂයන් තෝරාගනිමු
			48. සතුටින් ජීවිතය දිනන්නට නම්
			49. චරිතාපදාන
08	දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන	සිංහල	50. අම්මයි අප්පච්චියි භූමිකාව
			51. ඔබේ දරුවා හඳුනනවාද
			52. මතුරැකෙනා ශිල්පයමයි උගතමනා
			53. ගුණ නැණින් පිරි දරුවා
			54. අපේ සොඳුරු කැදැල්ලේ ආදරය

- **වෘත්තීය මාර්ගෝපදේශ සතිය ක්‍රියාත්මක කිරීම (2021.10.04 සිට 2021.10.10 දින දක්වා)**

දෙපාර්තමේන්තුවේ කාර්යයන් අතරින් ප්‍රමුඛතම කාර්යයක් වන වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ සංකල්පය ජනගත කිරීම සඳහාවෘත්තීය මාර්ගෝපදේශ සතියක් සැලසුම් කරනු ලැබූ අතර, 2021.10.04 දින සිට 2021.10.10 දින දක්වා මාර්ගගත ක්‍රමයට පැවැත්වීමට කටයුතු යොදා තිබුණි.මෙම සතිය තුළ පාසල්වල ඉගනුම ලබන 9,10,11 ශ්‍රේණි වල සිසුන් සඳහා ගද්‍ය රචනා, පද්‍ය රචනා, කථික, චිත්‍ර හා ප්‍රශ්න විචාරාත්මක තරග මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී.

ඒ අනුව මෙම සංකල්පය පිලිබඳ දරුවන්,ගුරුවරුන්, දෙමාපියන් ඇතුළු වැඩිහිටි ප්‍රජාව දැනුම්වත් කිරීම කාලයක් තිස්සේ සමාජයේ පැවති හිඩැසක් පිරවීමක් වශයෙන් හඳුනා ගනු ලැබූ අතර අනාගත වෘත්තීය දිශානතිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් හා අභිප්‍රේරණයක් ඇතිකර ගුණාත්මක හා නිපුනතාවයෙන් යුත් ශ්‍රම බලකායක් ගොඩනැගීමට දායකත්වය ලබා දීම මෙම වැඩසටහනෙහි අභිමතාර්ථය විය.

වෘත්තීය මාර්ගෝපදේශ සතිය තුල ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්

වෘත්තීයමාර්ගෝපදේශසතියතුළ ක්‍රියාත්මක වූ වැඩසටහන් අතර තවත් එක් සුවිශේෂී වැඩසටහනක් වූයේ **"සුපෝෂණ"**දේශන මාලාවයි.වෘත්තීය මාර්ගෝපදේශ විෂයයේ ඇති වැදගත්කම පිළිබඳව හා එහි භාවිතාවන් පිළිබඳ දැනුවත් කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ විය. ඒ අනුව දිවයිනමආවරණයවනපරිදිZoom තාක්ෂණය ඔස්සේ මෙය ක්‍රියාත්මක විය.

- **සුපෝෂණ අදියර - 01 (ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන්)**

අනු අංකය	දිනය	මාතෘකාව	සම්පත්දායකත්වය	සහභාගීත්වය
01	2021.06.07	හැඳින්වීම හා අරමුණ පැහැදිලි කිරීම	අනුෂා ගෝකුල ප්‍රනාන්දු මිය- අධ්‍යක්ෂ ජනරාල්	478
02	2021.06.08	දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු පිළිබඳ පැහැදිලි කිරීම	අනුරාධ විජේකෝන් මයා - ලේකම්,තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය	336
03	2021.06.09	වෘත්තීය මාර්ගෝපදේශය සහ එහි වැදගත්කම	තුෂාරි අනුරුද්ධිකා මිය	384
04	2021.06.10	වෘත්තීය යතුර,එහි භූමිකාව	ප්‍රියන්ත විජේගුණසේකර මයා	426
05	2021.06.11	වෘත්තීය මාර්ගෝපදේශකයාගේ භූමිකාව	රණසිංහ බණ්ඩාර මයා	289
06	2021.06.12	වෘත්තීය අධ්‍යාපනයේ වැදගත්කම	සන්ධ්‍යා මිය	262
07	2021.06.13	නිලධරයකුගේ පෞරුෂය	විජිතා දළුවත්ත මිය	284
				2459

- **සුපෝෂණ අදියර -02 (දෙමළමාධ්‍ය) - දැනුවත් කිරීමේ වැඩසටහන්**

අනු අංකය	දිනය	මාතෘකාව	සම්පත්දායකත්වය	සහභාගීත්වය
01	2021.06.21	දෙපාර්තමේන්තුවේඉදිරික්‍රියාකාරකම්පිළිබඳ හැඳින්වීම	අනුෂාගෝකුලප්‍රනාන්දු මිය- අධ්‍යක්ෂජනරාල් එන්.සංජීපන්මහතා (සහකාරඅධ්‍යක්ෂ)	171
02	2021.06.22	වෘත්තියමාර්ගෝපදේශය	U.Sureshkumar මහතා [HRDO] - මඩකලපුවදිස්ත්‍රික්කය A. කරුණාකරන්මහතා [DO] - මඩකලපුවදිස්ත්‍රික්කය	152
03	2021.06.23	වෘත්තියමාර්ගෝපදේශයසහඑහිවැදගත්කම	Jancy Lambert මහත්මිය [HRDO] - මන්නාරමදිස්ත්‍රික්කය K. තුලසිකුමාරිමහත්මිය [HRDO] - මන්නාරමදිස්ත්‍රික්කය	143
04	2021.06.24	වෘත්තියඉලක්කසහඅරමුණුසැලසුම්කිරීම	කේ.සිවප්‍රියමිය[HRDO] - යාපනයදිස්ත්‍රික්කය ලිස්ටන්රාජනිකාන්ත් මහතා [HRDO] - යාපනයදිස්ත්‍රික්කය	148
05	2021.06.25	වෘත්තීය මාර්ගෝපදේශ උපදේශකයාගේ කාර්යභාරය	එන්.කංගතරන්මහතා [HRDO] - අම්පාරදිස්ත්‍රික්කය HRDO] - අම්පාරදිස්ත්‍රික්කය එන්.අරුලානන්දම්මහතා [HRDO] - අම්පාරදිස්ත්‍රික්කය	156
06	2021.06.26	වෘත්තියයතුරසහඑහිකාර්යභාරය	B.Sribavan මහතා [HRDO] - කිලිනොච්චිදිස්ත්‍රික්කය P.Sivagowry මහත්මිය [HRDO] - මන්නාරමදිස්ත්‍රික්කය	128
07	2021.06.27	වෘත්තීය යතුර පරීක්ෂණය	B.Sribavan මහතා [HRDO] - කිලිනොච්චිදිස්ත්‍රික්කය	122
08	2021.06.28	නිලධාරියාගේපෞරුෂසංවර්ධනය	A. කරුණාකරන්මහතා [DO] - මඩකලපුවදිස්ත්‍රික්කය U.Sureshkumar මහතා [HRDO] - මඩකලපුවදිස්ත්‍රික්කය	114
09	2021.06.29	ඉදිරිපත්කිරීමේකුසලතා	කරුණාකරන්මහතා[HRDO] - යාපනයදිස්ත්‍රික්කය ආර්.පොන්නම්පලම්මහතා [HRDO] - යාපනයදිස්ත්‍රික්කය	142

10	2021.06.30	ජීවිතයජයගැනීමටමෘදුකුසලතා	S.Sivasorupan මහතාකිලිනොච්චිදිස්ත්‍රික්කය එස්.සුරේෂ්කුමාර්මහතාවවුනියාවදිස්ත්‍රික්කය B.Krishnanthy මහත්මියවවුනියාවදිස්ත්‍රික්කය	161
11	2021.07.01	වෘත්තීයඅධ්‍යාපනයේවැදගත්කම	J.Thusiraj මහතාමුලතිව්දිස්ත්‍රික්කය ජෙසීනාමහත්මියත්‍රිකුණාමලයදිස්ත්‍රික්කය	136
12	2021.07.02	වැඩසටහන් දළ විශ්ලේෂණය	අධ්‍යක්ෂජනරාල්	165
	සමස්ත			**1,738**

සුපෝෂණ අදියර - 03 (දැනුවත් කිරීමේ වැඩසටහන්)

අනු අංකය	දිනය	දිස්ත්‍රික්කය	මාතෘකාව
1	2021.07.16	කළුතර	නව යොවුන් වියේ දරුවා සහ දෙමාපිය භූමිකාව
2	2021.07.17	ගම්පහ	උසස්පෙළඵල ලැබීමට නම්
3	2021.07.18	කොළඹ	අනාගතවැඩලෝකය සඳහා හාණ්ඩ විෂයන් නිවැරදිව තෝරාගනිමු
4	2021.07.19	ගාල්ල	"වෘත්තීයතුරපරීක්ෂණය"අනුසාරයෙන් ව්‍යවසායකත්වය හඳුන්වාදීම
5	2021.07.20	මාතර	"ඔබේදරුවාගේ මාර්ගෝපදේශකයා ඔබයි" දෙමාපියන් සඳහා මාර්ගෝපදේශ වැඩසටහන
6	2021.07.21	හම්බන්තොට	ආවරණලිපිය හා ජීව දත්ත පත්‍රිකාව
7	2021.07.22	මහනුවර	රැකියාඅපේක්ෂිතයන්ට සහ වෘත්තීය පුහුණුවට යොමු වන්නන් සඳහා අභිප්‍රේරණ ක්‍රියාවලිය
8	2021.07.23	මාතලේ	අභිප්‍රේරණයසහඉගෙනුම්ක්‍රම
9	2021.07.24	බදුල්ල	සාමාන්‍යපෙළ,උසස් පෙළ දරුවන් සඳහා අධ්‍යාපන අරමුණු පිහිටුවීම,විභාග ඉලක්කය ගැනීම
10	2021.07.25	මොණරාගල	ඔබ සාර්ථක ව්‍යවසායකයකු වීමට අපේක්ෂා කරන්නේ නම්
11	2021.07.26	කුරුණෑගල	අධ්‍යාපනඉලක්ක සාධන උපායමාර්ග
12	2021.07.27	අනුරාධපුර	වෘත්තීයමාර්ගෝපදේශකයකු සතු විය යුතු සන්නිවේදන කුසලතා
13	2021.07.28	අම්පාර	ස්වයංරැකියාප්‍රවර්ධනවැඩසටහනසංවිධානයකිරීමසහපැවැත්වීමසම්බන්ධයෙන්අනුගමනයකළයුතු ක්‍රියාමාර්ග
14	2021.07.29	මාතර	නිර්මාණශීලිචින්තනය තුලින් වැඩ ලොව හැඩ කරමු

වෘත්තීයමාර්ගෝපදේශසකිය - 2021 "Inspired Career "YouTube නාලිකාවෙසජීවීWebinar වීඩියෝවිකාශය				
දිනය	**සම්පත්දායකත්වය**	**මාතෘකාව**	**මාධ්‍යය**	**නැරඹූ ගණන**
10/4/2021	ජේ.එම්.ටී.ජයසුන්දරමහත්මිය	වෙළඳපොලේසහශ්‍රමබලකායේවිදේශීයඅත්දැකීම්	සිංහල	**757**
10/5/2021	එරන්දිකදිසානායකමහතා	කොවිඩ් 19 වසංගතත්වයත්සමඟනවරැකියාවෙළෙඳපොළප්‍රවණතා	සිංහල	**516**
10/6/2021	ආචාර්යමහීෂ්	ව්‍යවසායකත්වයහාසම්බන්ධසමාජ-සංස්කෘතිකබාධක	සිංහල	**532**
10/7/2021	මහාචාර්යඑස්.සන්තිරසේකරම්	ව්‍යවසායකත්වයසහශ්‍රමවෙළඳපොළ	දෙමළ	**427**

වෘත්තීයමාර්ගෝපදේශසකියWebinar දේශනමාලාව (ප්‍රශ්නසහපිළිතුරුසාකච්ඡාව)					
දිනය	**සාකච්ඡාවමෙහෙයවීම**	**සම්පත්දායකත්වය**	**මාතෘකාව**	**මාධ්‍යය**	**නැරඹූ ගණන**
10/8/2021	ශානිකාමායාදුන්නේමහත්මිය අධ්‍යක්ෂක -NHREP	ආචාර්යකිෂූගෝමස්	අද්විතියලෙසසිතන්නසහඔබේවෘත්තියජීවිතයආලෝකමත්කරන්න	සිංහල	**1142**
10/9/2021	වනරාජාලෝගනාදන්මහතා HRDA-යාපනය	පොන්නයියානල්ලරත්නම්මහතා සහඑම්.අයින්තවිමහතා	සාර්ථකව්‍යවසායකයින්ගේචරිතකථා	දෙමළ	**221**
සමස්ත					**3,595**

පිරිවැය විශ්ලේෂණය

	භෞතික රැකියාපොළ වැඩසටහන	**මාර්ගගත රැකියාපොළ වැඩසටහන**
01	2019 වර්ෂයේ භෞතිකව දිස්ත්‍රික් 08 කපැවැත්වූ රැකියාපොළ වැඩසටහන් සඳහා වැය වූ මුළු මුදල රු.**3,312,263.88** දෙපාර්තමේන්තුව වැය කළ මුදල - **1,836,763.00**	2021 වර්ෂයේ මාර්ගගත ක්‍රමයට දිස්ත්‍රික් 25 ආවරණය වන පරිදි පැවැත්වූ රැකියාපොළ වැඩසටහනසඳහා වැය වූ මුදල රු.**16,000.00** පමණි.
02	රැකියාගතකිරීමේප්‍රගතිය සහභාගීවූගණන/දැනුවත්වූපිරිස **-11,935** රැකියාගතවූප්‍රමාණය**- 1,719** 1719/11,935 X 100 = **14.40 %** **රැකියාගතකිරීමසඳහාඑක්අයෙක්වෙනුවෙන්පිරිවැය** **3,312,263.88/1,719 =1,926.85(LKR)**	රැකියාගතකිරීමේප්‍රගතිය සහභාගීවූගණන/දැනුවත්වූපිරිස **-3,967** රැකියාගතවූප්‍රමාණය**- 460** 460/3,967 X 100 = **11.59%** **රැකියාගතකිරීමසඳහාඑක්අයෙක්වෙනුවෙන්පිරිවැය** **16,000/460 = 34.78 (LKR)**

වෘත්තීය මාර්ගෝපදේශ සතියෙහි තරඟ තොරතුරු

වෘත්තීය මාර්ගෝපදේශ සතිය 2021 - පිළිගත් තරඟ අයදුම්පත්							
2021/9/12 20:00:03							
පදිංචි දිස්ත්‍රික්කය	කථික	ගද්‍ය රචනා	චිත්‍ර .තරඟය	දැනුම මිනුම	පද්‍ය රචනා	වැඩිහිටියන් සඳහා ගද්‍යරචනා විවෘත	මුළු එකතුව
කොළඹ	432	398	392	1201	170	80	**2673**
මාතර	375	408	361	1223	159	94	**2620**
යාපනය	440	547	268	846	192	40	**2333**
කුරුණෑගල	345	470	287	896	134	91	**2223**
මහනුවර	304	389	267	847	112	117	**2036**
අම්පාර	224	599	332	648	177	30	**2010**
මඩකලපුව	163	592	364	599	164	46	**1928**
කළුතර	217	339	213	798	127	51	**1745**
ගාල්ල	218	356	242	724	88	111	**1739**
හම්බන්තොට	288	200	153	918	73	33	**1665**
ගම්පහ	180	312	241	399	120	210	**1462**
අනුරාධපුර	190	245	188	625	93	48	**1389**
පුත්තලම	143	257	239	460	76	51	**1226**
බදුල්ල	116	176	135	310	75	33	**845**
මන්නාරම	76	212	98	279	84	15	**764**
මොනරාගල	110	150	128	264	61	27	**740**
රත්නපුරය	107	150	106	259	64	36	**722**
මාතලේ	89	135	90	290	40	25	**669**
නුවරඑළිය	60	137	99	283	38	29	**646**
කෑගල්ල	73	124	95	174	48	43	**557**
වවුනියාව	43	143	94	127	42	32	**481**
පොළොන්නරුව	54	57	70	237	28	28	**474**
කිලිනොච්චි	61	112	51	166	46	12	**448**
මුලතිව්	43	132	47	134	32	10	**398**
ත්‍රිකුණාමලය	26	53	21	30	14	12	**156**
මුළු එකතුව	**4,377**	**6,693**	**4,581**	**12,737**	**2,257**	**1,304**	**31,949**
ප්‍රතික්ෂේපකළඅයදුම්පත්							
වක්‍රලේඛයටඅනුවවයස්සීමාවඉක්මවූ	216	418	223	625	179	22	**1583**
*ඇමුණුම්නැත (චිත්‍ර/ කවි / රචනය/ ප්‍රකාශය) **		1439	1135		455	151	**3316**
ද්විත්වඅයදුම්පත්	259	537	342	774	131	59	**1966**
අසම්පූර්ණඅයදුම්පත්	5	22	102	7	16	1	**153**
	කථික	ගද්‍ය රචනා	චිත්‍ර .තරඟය	දැනුම මිනුම	පද්‍ය රචනා	වැඩිහිටියන් සඳහා ගද්‍ය රචනා	**සම්පූර්ණ**

වෘත්තීය මාර්ගෝපදේශ සතිය හරහා දැනුවත්වූ පුද්ගලයින් සංඛ්‍යාව

වැඩසටහන	දැනුවත්වූ සංඛ්‍යාව
සුපෝෂණ අදියර - 01	2,459
සුපෝෂණ අදියර - 02	1,738
සුපෝෂණ අදියර - 03	3,014
“Life Talk” වැඩසටහන	1,579
දෙපාර්තමේන්තුවේ YouTube නාලිකාවේ සජීවී වීඩියෝ විකාශන	21,766
වෘත්තීය මාර්ගෝපදේශ සතිය2021 – Inspired Career YouTube නාලිකාවේ Webinar Series සජීවී වීඩියෝ විකාශන	3,595
රැකියා පොළ වැඩසටහන්	3,967
වෘත්තීයමාර්ගෝපදේශ සතියෙහි තරඟ	38,967
සමස්ත	**77,085**

වැඩසටහන සඳහා දැරූ මුළු පිරිවැය - 7,206,464.20 (LKR)

දැනුවත්වූ පුද්ගලයින් සංඛ්‍යාව - 77,085

දැනුවත් කිරීම සඳහා එක් අයෙක් වෙනුවෙන් පිරිවැය - 7,206,464.20/77,085 = 93.48

වෘත්තීය මාර්ගෝපදේශ සතියට සමගාමීව පැවති මාර්ගගත රැකියාපොළ වැඩසටහනෙහි ප්‍රගතිය

	දිස්ත්‍රික්කය	දිනය	සහභාගී වූ රැකියාඅපේක්ෂිතයින් ගණන	සහභාගී වූ රැකියාසපයන පුද්ගලික ආයතනගණන	සහභාගී වූ පුහුණුආයතන	පුහුණුව සඳහායොමු කිරීම්	රැකියාගත කළප්‍රමාණය
1	ජාතික රැකියා පොළ වැඩසටහන (අනුරාධපුර, පොළොන්නරුව, නුවරඑළිය, පුත්තලම)	2021/10/07	250	12			24
	ජාතික රැකියා පොළ වැඩසටහන (වව්නියාව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, අම්පාර)	2021/10/08	264	20			51

	ජාතික රැකියා පොළ වැඩසටහන (කොළඹ, ගම්පහ, බදුල්ල, මොණරාගල, කෑගල්ල)	2021/10/09	730	22			76
2	හම්බන්තොට	2021/10/07	106	13	2		28
3	මාතර	2021/10/07	320	13	3		33
4	මහනුවර	2021/10/07	183	10			26
5	කිලිනොච්චිය	2021/10/07	58	6			0
6	මාතලේ	2021/10/07 , 08	155	12			20
7	කුරුණෑගල	2021/10/08	455	15	4	18	38
8	යාපනය	2021/10/08	205	10			23
9	රත්නපුර	2021/10/08	186	16		9	12
10	කළුතර	2021/10/08	458	13	1		10
11	මඩකලපුව	2021/10/09	142	18			42
12	ගාල්ල	2021/10/09	455	19	1		77
	එකතුව		**3967**	**211**	**11**	**27**	**460**

2.1.3. තොරතුරු තාක්ෂණ අංශය

දෙපාර්තමේන්තු වෙබ් අඩවිය, You Tube වැනලය, Face Book පිටුව ප්‍රති නිර්මාණය කරමින් කෙටි කාලයක් තුල මහජනතාව අතර ප්‍රචලිත කිරීමට කටයුතු කරන ලදි.

2021 නොවැම්බර් වන විට,

- වෙබ් අඩවිය 60,000 පමණ පිරිසක් පරිශීලනය කර ඇත.(www.dome.gov.lk)
- YouTube වැනලය- 2530 ක් subscribe කර ඇත. (Inspired Career)-(https://www.youtube.com/c/Inspired career)
- Face Book Page හි Followers 7700 කි. (https://www.facebook.com/dome.gov.official)

දෙපාර්තමේන්තුවේ YouTube වැනලය නැවත සකස් කර නව මුහුණුවරකින් ඉදිරිපත් කිරීමට කටයුතු ආරම්භ කර ඇත. මේ අනුව "Yes We Can" යනුවෙන් තිබූ නාමය "Inspired Career" ලෙස වෙනස් කොට නව මුහුණුවරකින් මුදා හැරීමට කටයුතු කරන ලදී.

කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම(MIS)-අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා මූලික සාකච්ඡා පවත්වා අදාල මෘදුකාංගය වැඩිදියුණු කිරීම Bellvantage ආයතන වෙත පවරා ඇත.

Life talk වැඩසටහන- සමස්ථ වැඩසටහන සම්බන්ධීකරණය host කිරීම සහ ඇතැම් වැඩසටහන් මෙහෙයවීම මෙම අංශය මඟින් සිදුවේ.

2.1.4. ජාත්‍යන්තර සබඳතා අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහයෝගය ඇතිව ආරම්භ කරන ලද ආබාධිත ප්‍රජාවගේ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ වැඩසටහනෙහි උතුරු පළාත් ආරම්භක වැඩසටහන 2021.02.17 දින සිට 2022.03.31 දක්වා ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාව සහ දකුණු කොරියාව අතර ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා උපදේශනාත්මක වැඩසටහන ද මෙම අංශය මඟින් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ඇත. එම ව්‍යාපෘතිය 2022 -2026 අතර කාලය තුල සිදු කිරීමට නියමිතව ඇත.

මීට අමතරව, සංක්‍රමණික සේවකයන්ට සහය වීම සඳහා මහජන රැකියා සේවය ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා ද ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහයෝගය ලබා දීමට එකඟතාවය පළ කර ඇත.

මානව සම්පත් කළමණාකරණය හා විදේශ සබඳතා අංශය විසින් සෑම මසකම දෙපාර්තමේන්තුවට අදාල අයුරින් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි ලිපි පලකිරීම ද සිදු කරනු ලැබේ.

මානව සම්පත් කළමනාකරණ හා ජාත්‍යන්තර සබඳතා අංශයේ ඉදිරි දැක්ම උපාය මාර්ගික සැලසුම් වශයෙන්, ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සහ මානව සම්පත් කළමණාකරණ හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක මට්ටම ගෙන ඒමට කටයුතු කරමින් පැවතීම සහ රැකීරක්ෂා ප්‍රතිපත්ති හා මානව සම්පත් සංවර්ධනයට අදාල දේශීය, විදේශීය ආයතන සමඟ අඛණ්ඩව සබඳතා ගොඩනගා ගනිමින් ඉදිරි කටයුතු කිරීම හැඳින්විය හැකිය.

- **ශ්‍රීලංකාවේ උතුරුපළාතේ ආබාධ සහිත තැනැත්තන් රැකියාගත කිරීම හා රැකියා මාර්ගෝපදේශනය මගින් ආර්ථිකයට දායක කරවීමට උනන්දුකිරීමේ ව්‍යාපෘතිය - ILO අනුබද්ධ ව්‍යාපෘතිය**

	වැඩසටහනේ නම	දිස්ත්‍රික්කය	පවත්වන ලද වැඩසටහන් ගණන	ප්‍රතිලාභීන් ගණන	රැකියා ගත කිරීම් ගණන	වියදම
1	ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන (මහජන රැකියා සේවා මධ්‍යස්ථානයන්හි නිලධාරීන් සඳහා)	වව්නියාව හා මන්නාරම	1	27	-	52,198.50
		මුලතිව්, යාපනය හා කිළිනොච්චි	1	25		67,510.20
	Total			**50**		
2	රැකියා අපේක්ෂිතයන් හඳුනා ගැනීම (employability status by self-awareness program)	මන්නාරම	5	100	-	125,000.00
		යාපනය	15	295		374,019.10
		වව්නියාව	4	80		100,000.00
		කිළිනොච්චි	4	80		100,000.00
		මුලතිව්	6	110		136,750.00
	Total			**665**		
3	දිස්ත්‍රික් රැකියා පොළ සමගාමීව රැකියා අපේක්ෂිතයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන (සම්මුඛ පරීක්ෂණ සඳහා මුහුණ දීම සඳහා)	මන්නාරම	1	50	10	105,000.00
		යාපනය	1	150	15	336,700.00
		වව්නියාව	1	40	3	94,000.00
		කිළිනොච්චි	1	40	10	94,000.00
	එකතුව		41	995	38	1,491,177.80

2.1.5. මහජන රැකියා සේවා අංශය මඟින් 2021 වර්ෂයේ ඉටුකරනු ලැබූ කාර්යයන්

- දිස්ත්‍රික්කයේ පුද්ගලික ආයතනවල පවතින රැකියා පුරප්පාඩු සොයාගැනීම සඳහා දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර වෙත සති අග සිංහල, දමිළ හා ඉංග්‍රීසි පුවත්පත් මිළදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන යොමුකිරීම.

- **'ගම සමඟ පිළිසඳරක්'** වැඩසටහන යටතේ ජනාධිපති කාර්යාලය මගින් යොමුකළ රැකියා ඉල්ලීම් 1642පුද්ගලික අංශයේ රැකියා සඳහා යොමුකිරීමට අදාල දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර වෙත යොමුකිරීම හාඊට අදාල ප්‍රගතිය ලබාගැනීමට කටයුතු කිරීම.

- අගමැති කාර්යාලය මගින් යොමුකළ රැකියා ඉල්ලීම් 1362 පුද්ගලික අංශයේ රැකියා සඳහා යොමුකිරීමට අදාල දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර වෙත යොමුකිරීම හාඊට අදාල ප්‍රගතිය ලබාගැනීමට කටයුතු කිරීම.

- වෘත්තීය මාර්ගෝපදේශ සතියට සමගාමීව මාර්ගගත ක්‍රමයට දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන් පැවැත්වීම හා ඒ හරහා රටතුළ විරැකියාව අවම කිරීමට දායකවීම.

- දෙපාර්තමේන්තුවට අනුයුක්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින නිලධාරීන් සඳහා ස්මාර්ට් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ Tab පරිගණක යන්ත්‍ර ලබාදීමට කටයුතු කිරීමමගින් දෙපාර්තමේන්තු කාර්යයන් වඩාත් පහසුකිරීම

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සඳහා අත්‍යවශ්‍ය කාර්යාලීය උපකරණ ලබාදීම

- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන්ට පුහුණු වැඩසටහන් සිදුකිරීමේදී අවශ්‍ය වන උපකරණ කට්ටල (Tool Kit) මිළදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන යොමුකිරීම

- ගාල්ල, මාතර, ත්‍රිකුණාමලය හා මන්නාරම යන දිස්ත්‍රික්වල පිහිටි දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර නවීකරණය කිරීමට කටයුතු කිරීම

රැකියා කේන්ද්‍රනවීකරණයන්





ටැබ් පරිගණක යන්ත්‍ර ලබාදීමේ වැඩසටහන්





යාපනය දිස්ත්‍රික් ආබාධ සහිත පුද්ගලයින් සඳහා සිදු කරන ලද රැකියා පොළ වැඩසටහනින්





මූලතිව් දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනින්





ඉදිරි ඉලක්ක - 2022 -2026

1. 2023 වර්ෂයේදී තරුණ මානව සම්පත් දත්ත බැංකුව ස්ථාපනය කිරීම

2. ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතයහා සම්බන්ධිත ගැටළු හඳුනාගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම සහ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය වර්ධනය කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිමය වෙනස්කම් පිළිබඳ සංවාදයක් හා සමාජ කතිකාවක් ඇතිකිරීම.

3. 2022 වර්ෂය තුල හඳුනාගත් විෂය ක්ෂේත්‍ර 10 ට අදාලව නව සේවා නියුක්ති අවස්ථා හඳුනාගැනීමේ පර්යේෂණ 8ක් සිද්ධි අධ්‍යනන 2 ක් පැවැත්වීම.

4. වෘත්තීය මාර්ගෝපදේශන විෂය ක්ෂේත්‍රය සඳහා සම්මතකරණයන් හාරෙගුලාසි හඳුන්වා දීම.

5. අ.පොෂ. (සා.පෙළ) සඳහා පෙර සුදානම් වන පාසල් සිසුන් 40,000 ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සේවා ලබාදීම.

6. දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ විෂයයන් අලලා පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් බුද්ධි කළමනාකරණ සැසි 6 ක් පැවැත්වීම හා පාර්ශ්වකරුවන් සමඟ දැනුම හුවමාරුකර ගැනීම.

7. වෘත්තීය පුහුණු ආයතනවලට යොමු වන පුහුණුලාභීන්ගෙන් පුහුණුව සම්පූර්ණ කිරීමට පෙර ඇතිවන පුහුණුව හැරයාමේ අනුපාතය අවම කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

අමුතා ගෝතුළ ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
9 වන මහල, ... - දෙවන අදියර
බත්තරමුල්ල.



සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය සැලසුම් හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාකාරී වන අනු ඒකකයක් වන අතර එම ඒකකය අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ) යටතේ පාලනය වේ. මෙම ඒකකයේ කාර්ය මණ්ඩලය සහකාර අධ්‍යක්ෂවරයක්, මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත වේ.





















2021 වර්ෂය සඳහා අප විසින් දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා දේශීය අවස්ථා ලබා දී ඇති අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉතා ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන ලදී. රට තුළ පැවති කෝවිඩ් - 19 වසංගත තත්වය හමුවේ වෙනත් වර්ශයන්ට සාපේක්ෂව පුහුණු වැඩසටහන්අඩු සංඛ්‍යාවක් සඳහා නිලධාරීන් සහභාගි කරවීමට සිදු වූ බව දන්වා සිටිනු කැමැත්තෙමි. ඒ තුලින් වඩා විධිමත් සහ කාර්යක්ෂම සේවාවක් මහජනතාවට ලබා දීම අපගේ අරමුණ විය.

03

පරිච්ඡේදය

වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2021.12.31 දිනෙන් අවසන් වූ කාල සිමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.000

අයවැය 2021		සටහන	තක්ෂ	
			2021 රු.	නැවත ගලපන ලද 2020
	ආදායම් ලැබීම්			
	ආදායම් බදු	1	-	-
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-
	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-
	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-
	මුළු ආදායම් ලැබීම් (අ)		-	-
	ආදායම් නොවන ලැබීම්			
	භාණ්ඩාගාර අග්‍රිම		482,763,864	405,870,000
	තැන්පතු		2,030,760	1,459,802
	අත්තිකාරම් ගිණුම්		16,035,498	12,761,513
	වෙනත් ප්‍රධානලෙජර් ගිණුම් ලැබීම්			
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**500,830,122**	**420,091,315**
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ (ආ)+(අ) =		**500,830,122**	**420,091,315**
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		6,927,868	-
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ (ඇ)-(ඇ) =		**493,902,254**	**420,091,315**
	අඩු කළා වියදම් :			
	පුනරාවර්තන වියදම්			
361,330,000	වැටුප්, වේතන සහඅනෙකුත් සේවක ප්‍රතිලාභ	5	357,391,941	341,520,825
72,820,000	අනෙකුත් භාණ්ඩ හාසේවා	6	67,398,501	60,755,460
7,500,000	සහනාධාර, ප්‍රදානසහ මාරුකිරීම්	7	7,383,501	8,485,417
-	පොළී ගෙවීම්	8	-	-
100,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	13,025
441,750,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**432,173,943**	**410,774,727**
	මූලධන වියදම්			
2,750,000	මූලධනවත්කම් පුනරුත්ථාපනය හා	10	2,528,217	4,740,849
	වැඩිදියුණු කිරීම්			
1,500,000	මූලධනවත්කම් අත්පත් කර ගැනීම්	11	1,492,361	11,605,351

-	ප්‍රාග්ධනමාරුකිරීම්	12	-	-
-	මූල්‍යවත්කම් අත්පත් කර ගැනීම	13	-	-
2,500,000	හැකියාවර්ධනය	14	2,362,771	541,822
49,299,500	වෙනත්මූලධන වියදම්	15	19,022,863	18,399,800
56,049,500	**මුළු මූලධන වියදම් (ඇ)**		**25,406,212**	**35,287,822**
	තැන්පතු ගෙවීම්		2,208,119	1,201,756
	අත්තිකාරම් ගෙවීම්		17,380,270	10,474,062
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-
	ප්‍රධාන ලෙජර් වියදම් (ඈ)		**19,588,389**	**11,675,818**
	මුළු වියදම් එ (ඈ+ඇ+ඊ) =		**477,168,544**	**457,738,367**
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ(එ-		**16,733,710**	**(37,647,052)**
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**16,733,710**	**(37,647,052)**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-

3.2. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනටමූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	**තත්‍ය**	
		202.රූ1	**.රූ 2020**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසිඒ 6-	139,304,754	95,997,889
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ5 -/ඒ	39,010,612	37,665,840
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ3 -	-	-
මුළු වත්කම්		**178,315,366**	**133,663,729**
ශුද්ධ වත්කම් /ස්කන්ධය			

ශුද්ධ වත්කම්		38,818,712	37,296,581
දේපළ පිරියත හා උපකරණ සංචිතය		139,304,754	95,997,889
කුලි හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ)5-ආ(		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ4-	191,900	369,259
අග්‍රිම ශේෂය	ඒසිඒ3-	-	-
මුළු වගකිම්		**178,315,366**	**133,663,729**

පිටු අංක 01 සිට 25දැක්වෙන ඉහත ඒසිඒ 1 සිට ඒසිඒ6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 26සිට 57දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මුල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ඊට අදාළගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරි	ගණන් දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම	නම	නම
තනතුර	තනතුර	තනතුර
දිනය	දිනය	දිනය

අනුරාධ විජේකෝන්
ලේකම්
කරුණා සහ දිඩා අමාත්‍යාංශය
අංක. 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

අදුනා ගෝතුළ ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
9 වන මහල, [illegible] - දෙවන අදියර
බොරැල්ලේ.

ඒ. මෝහනරාජ්
ප්‍රධාන ගණකාධිකාරි
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

3.3. මුදල් ප්‍රවාහ පිළබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වනමුදල් ප්‍රවාහ පිළබඳ ප්‍රකාශය

	තත්‍ය	
	2021	2020
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	21,482,750	17,148,479
වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලදආදායම්	-	-
අග්‍රිම ලැබීම්	482,763,864	405,870,000
අත්තිකාරම් අයකර ගැනීම්	17,497,872	12,761,513
තැන්පතු ලැබීම්	2,030,760	1,459,802
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්ප්‍රවාහය (අ)	**523,775,246**	**437,239,794**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	409,306,985	383,625,281
සහනාධාර සහ මාරුකිරීම්	7,383,501	8,485,417
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	66,688,340	462,655
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	6,927,868	-
අත්තිකාරම් ගෙවීම්	17,389,493	10,474,062
තැන්පතු ගෙවීම්	2,208,119	1,201,756
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**509,904,306**	**404,249,171**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**(13,870,940)**	**(32,990,623)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික	-	-

වත්කම්විකිණීම		
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත්ආයෝජන අත්කර ගැනීම්	13,870,940	32,990,623
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල්ප්‍රවාහය (ඉ)	**13,870,940**	**32,990,623**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**13,870,940**	**32,990,623**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල්ප්‍රවාහය (ඌ)		
අඩුකළා : මුදල් වැය කිරීම්	-	-
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල්ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

මූල්‍ය ප්‍රකාශ සටහන්

3.4ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %ලෙස
අදාල නොවේ.					

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	441,750	441,750	432,174	98
ප්‍රාග්ධන	53,750	56,049	25,406	45

3.6 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

පරිත්‍යාග කළ ආයතනය	පරිත්‍යාගයේ අරමුණ	පරිත්‍යාග මුදල

3.7. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු,000

වත්කම් කේතය	කේත විස්තරය	දිනට31.12.2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021දිනටමූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලිහා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	139,305	139,305		100
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීවවිද්‍යාත්මකවත්කම්				
9160	කෙරිගෙනයනවැඩ				
9180	බදුදෙනලදවත්කම්				



ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ ඒකකය

ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ ජාලයේ ශ්‍රී ලාංකික කොටස්කරුවා වශයෙන් කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීම සඳහාත්, ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන්, පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයින් සඳහාත් අවශ්‍ය ශ්‍රම වෙළඳපොළ තොරතුරු භාවිතයට පහසු වන ආකාරයෙන් සියළු පාර්ශවකරුවන් වෙත සම්පාදනය කර දීම උදෙසා බිහි කරන ලද අංශයයි.













3.8. විගණන වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. SYA/A/DOME/02/21/13 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 මැයි 31 දින



අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 9

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

(අ) 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 චක්‍රලේඛයේ 3.1 ඡේදය පරිදි **CIGAS** වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් SA 21 ආකෘතියේ පිළියෙල කරන ලද අවසාන භාණ්ඩාගාර ශේෂ පිරික්සුම් ඉදිරිපත් කළ යුතු වුවද, 2021 දෙසැම්බර් මාසයට අදාළ ශේෂ පිරික්සුම් මූල්‍ය ප්‍රකාශනයට අමුණා නිබුණි.

(ආ) මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.2 ඡේදයෙහි විවර්තාකරණ ආයතනය විසින්, වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙතුවෙන් එකතු කරනු ලබන ආදායම්, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කල යුතු බවත් ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යාද ඒ අනුව දැක්විය යුතු බවත් සඳහන් වේ. නමුත් මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ආදායම් ලෙස රු.21,482,750ක් දක්වා නිබුණද ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යා නොරතුරු දක්වා නොනිබුණි.

(ඇ) එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයයක් වෙතුවෙන්ම මුළු ඉද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම් අතර වෙනස හා එම වෙනසට හේතු ඒ.සී.ඒ. – 2 (ii) ආකෘතියෙහි දැක්විය යුතු වුවද 328-1-1-2-2509 (වෙනත්) හා 328-1-1-6-2509 (වෙනත්) යන වැය විෂයයන් හි රු.3,958,574 ක ඉතිරියට හේතු දක්වා නොනිබුණි.

(ඈ) 328-1-1-1002 වැය විෂයයේ ඉතිරියට හේතුව ලෙස කොවිඩ් වසංගතය හේතුවෙන් අපේක්ෂිත වියදම් සිදු නොවීම ලෙස දක්වා නිබුණද, එම වැය විෂයයට මුදල් රෙගුලාසි 66 යටතේ රු.830,000ක් හෙවත් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 83ක් ප්‍රතිපාදනය සලසාගෙන නිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව අධි ප්‍රතිපාදන සලසා ගැනීම ඉතිරියට හේතු වී නිබුණු බව නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නිබුණු ඒසීඒ - 6 ආකෘතිය පරිදි අපහරණය කල බවට සඳහන් කර නිබුණු රු.5,343,130 ක වත්කම් සම්බන්ධයෙන් විස්තරාත්මක නොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී එම වටිනාකමේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මූලධන වැය විෂයන් 06 ක් හා පුනරාවර්තන වැය විෂයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.32,850,307 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි.

2.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම

(අ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/02 හා 2021/10/26 දිනැති චක්‍රලේඛයේ 3.5 ඡේදයේ පරිදි 2021 වර්ෂය තුළ යම් දෙපාර්තමේන්තුවක් විසින් වෙනත් රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් භාණ්ඩ හා සේවා ලබා ගෙන ඇත්නම් ඊට අදාල බිල්පත් 2021 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර පියවා ගිණුම් ගත කිරීමට පියවර ගත යුතු බවට දක්වා තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට අවස්ථා 28ක දී ඇනිකරගත් රු.4,563,252ක බැරකම් අදාල චක්‍රලේඛ උපදෙස් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/02 හා 2021/10/26 දිනැති චක්‍රලේඛයේ 4.5 ඡේදය පරිදි එක් එක් වියදම් ශීර්ෂ වෙනුවෙන් මු.රෙ. 94 (1) ට අනුකූලව බැඳීම් හා බැරකම් වාර්තාවක්, පළමු භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනය සමග නිකුත් කරනු ලබන බව හා තවදුරටත් සිදු කළ යුතු ගැලපීම් තිබේ නම් එකී ගැලපීම් සිදු කර පළමු පරිපූරක ගිණුම් සාරාංශය මගින් වාර්තා කල යුතු වේ. තවද එලෙස වාර්තා නොකරන කිසිදු බැඳීමක් හෝ බැරකමක් 2022 වර්ෂය තුළ නිරවුල් නොකල යුතු බව දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක (iii) හි සඳහන් අවස්ථා 19 දී ඇනිකරගෙන තිබුණු රු.8,313,448 ක් වූ බැරකම් හා මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණු අවස්ථා 04 දී ඇනිකරගෙන තිබුණු රු.3,018,942 ක් වූ බැඳීම් හා බැරකම් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ උපදෙස් පරිදි නව සිගාස් වෙබ් යෙදුම් වෙත උඩුගත කර (upload) නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/02 හා 2021 ඔක්තෝබර් 26 දිනැති චක්‍රලේඛයේ 4.5 ඡේදය පරිදි එක් එක් වියදම් ශීර්ෂ විසින් මූ.රෙ. 94(1) ට අනුකූලව නව සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කරන ලද බැඳීම් වාර්තාවක් පලමු භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනය සමග නිකුත් කරනු ලබන බවත් බැඳීම් හා බැරකම් පිළිබඳ තවදුරටත් සිදුකළ යුතු ගැලපීම් තිබේ නම් එකී ගැලපීම් සිදු කර පළමු පරිපූරක ගිණුම් සාරාංශය මගින් වාර්තා කළ යුතු බවට උපදෙස් දී නිබුණද මූල්‍ය ප්‍රකාශනයේ සටහන III හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන (SA-92) සමග අවස්ථා 16 රු. 4,501,964 ක් වැඩියෙන් හා අවස්ථා 16 රු. 829,205 ක් බැරකම් අඩුවෙන් දක්වා නිබුණු බැවින් අදාල උපදෙස් පරිදි කටයුතු කර නොනිබුණු බව නිරීක්ෂණය විය.

2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

2.3.1 මුදල් රෙගුලාසි 371(5) පරිදි කාර්යය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කල යුතු වුවද නිලධාරීන් හතර දෙනෙකු වෙත අවස්ථා 13 දී ලබා දී නිබුණු අග්‍රිම මුදල් පියවීම දින 17 සිට දින 165 දක්වා කාල ප්‍රමාදයකින් නිරවුල් කර නිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 අපේක්ෂිත කාර්යසාධන මට්ටම් ලබා නොගැනීම

(අ) රැකියා පියස වැඩසටහන යටතේ වූ කොරියානු ජනරජයේ රැකිරක්ෂා හා කම්කරු අමාත්‍යාංශය විසින් කොරියානු - ශ්‍රී ලංකා ප්‍රතිපත්ති උපදේශනාත්මක වැඩසටහනට අදාල ව්‍යාපෘතිය සේවා නියුක්ති ප්‍රතිපත්ති සහ ශ්‍රම වෙළඳපොල සක්‍රීයකරණ වැඩසටහන් මහජන රැකියා සේවා සංවිධානය කිරීම, ව්‍යුහය හා වැඩසටහන් පිළිබඳ ඵලදායී ක්‍රමවේද නුවමාරු කිරීම යන ක්ෂේත්‍ර යටතේ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී තිබුණි. ඒ අනුව 2020 ජුනි 23 දින ශ්‍රී ලංකාවේ මහජන රැකියා සේවය නහා සිටුවීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනයට අදාල ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව ඇහයීම සඳහා 2020 නොවැම්බර් 18 වන දින ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ ඒකගතාවය ලබාගෙන තිබුණි. කොරෝනා වසංගතය හේතුවෙන් මෙම ව්‍යාපෘතියට අදාළව කිසිදු ක්‍රියාකාරකමක් 2021 වසරේ සිදු වී නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතියට අදාලව ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම ඉලක්ක කර ගනිමින් රැකියා කුසලතා සහිත මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 20ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද එයින් රු.මිලියන 1.9 ක් එනම් සියයට 9 ක් පමණක් වැයකර තිබුණි. මේ අනුව ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම 2021 දෙසැම්බර් 31 දිනට නිමවී නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ සිසුන් සඳහා වූ ව්‍යාපෘති වැඩසටහන සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) ශ්‍රම වෙළඳපොල තොරතුරු සඳහා කලමණාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය (වැය විෂය - 328-1-1-12-2509) කිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් 10 දින මෘදුකාංග ආයතනයක් තෝරා ගැනීමට ප්‍රසම්පාදන කටයුතු පමණක් ආරම්භ කර තිබුණු අතර ඒම ව්‍යාපෘතියේ ප්‍රගතියක් අත්කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ආබාධ සහිත පුද්ගලයන් ආර්ථික අංශයට ඇතුළත් කර ගැනීම සඳහා රැකියා ගත කිරීම හා ස්වයං රැකියා සඳහා මහ පෙන්වීම සඳහා වූ ලෝක කම්කරු සංවිධාන ව්‍යාපෘතිය (වැය විෂය - 328-1-1-14-2509 (13)) යටතේ රු. මිලියන 2.299ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයන් රු. මිලියන 1.777ක් වැයකර උතුරු පළාතේ දිස්ත්‍රික්ක 05ක ප්‍රතිලාභීන් 680ක් හඳුනා ගෙන තිබුණද අතර එයින් 45 දෙනෙකු පමණක් රැකියාගත කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) රැකියා පියස වැඩසටහන සඳහා රු.3,000,000 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදලින් රු.1,348,000 ක් වියදම් කර තිබුණු අතර එය ප්‍රතිපාදනයෙන් සියයට 45ක් වී තිබුණි. තවද, රැකියා අපේක්ෂිතයන් 145,175ක් ලියාපදිංචි කිරීමට ඉලක්ක ගත කර තිබුණද 70,124ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. ඒ අනුව රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය සියයට 48 කි. 2021 රටතුළ පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ රට වරින් වර වසා දැමීම හේතුවෙන් නියමිත ඉලක්ක ලගාකර ගැනීමට නොහැකි වී තිබුණු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ සම්බන්ධයෙන් කරුණු දක්වා තිබුණි.

(උ) වෘත්තීය මාර්ගෝපදේශනයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාලව යෝජනා වැඩසටහන් 09 ක් සඳහා 2021 වර්ෂයට අදාලව රු.මිලියන 184.5ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා දී තිබුණු අතර සංශෝධිත ඇස්තමේන්තුව අනුව රු.මිලියන 159ක ප්‍රතිපාදන සලසා දී තිබුණි. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 104.6 ක් වියදම් කර තිබුණු අතර එමඟින් රැකියා අපේක්ෂකයින් 77,124 ක් ලියාපදිංචි කර මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා මෙම රැකියා විරහිත තරුණ තරුණියන් හට පෞද්ගලික අංශයේ රැකියා 7,759 ක් පමණක් ලබාදී තිබුණි. 2021 රටතුළ පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ රට වරින් වර වසා දැමීම හේතුවෙන් පසුගිය වසර තුළ නියමිත ඉලක්ක ලගාකර ගැනීමට නොහැකි වී තිබුණු බවට මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරුණු දක්වා තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක්, තෘතීය මට්ටමේ පුරප්පාඩු 05 ක්, ද්විතික මට්ටමේ පුරප්පාඩු 26 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 05 ක් ඇතුළු මුළු පුරප්පාඩු 40 ක් පැවතුණි. අධ්‍යක්ෂ තනතුරු 04 ක්ද, අභ්‍යන්තර විගණක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි හා භාෂා පරිවර්තක එක තනතුරක් බැගින්ද, සංවර්ධන නිලධාරි තනතුරු 15 ක් හා කළමනාකරණ සේවා නිලධාරීන් 11ක් ඇතුළු මුළු සේවක උනෙතාවයන් සම්පූර්ණ කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

එච්.එම්. රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04

පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක



මහජන රැකියා සේවා අංශය

ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය සඳහා පුද්ගලික අංශයේ ඵලදායී රැකියා අවස්ථාවන් කාර්යක්ෂම ලෙස ලබාදීම අරමුණු කරගෙන දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර (මහජන රැකියා සේවා මධ්‍යස්ථාන) ස්ථාපිත කර ඇත. දිවයිනේ දිස්ත්‍රික්ක 25හි මෙම දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර ක්‍රියාත්මක වේ.










MARDAP



4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් නිමැවුමලෙස තක්ෂ(%)		
	90% – 100%	89% - 75%	74% - 50%
රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචිය			48%
ඇබෑර්තු ලියාපදිංචිය		80%	
රැකියා ගත කිරීම			33%
පාසැල් සිසුන් සඳහා සිදු කරන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ගණන			64%
ස්වයං රැකියා පෙළඹවීමේ වැඩසටහන් ගණන	106%		
ස්වයං රැකියා හා ව්‍යවසාය ආරම්භ කිරීම			20%

05

පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			1% - 50%	50% - 74%	75% - 100%
තිරසර සංවර්ධන අරමුණු 4 - පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	ඉලක්කය 4.3. 2030 වන විට සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුලත්ව තාක්ෂණික,වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම	සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම			89%
		උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගෙන් 20% කට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම	42%		
		2021 වසරේදී දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් වසරකට දීපව්‍යාප්තව 310ක් පැවැත්වීම			140%
	ඉලක්කය 4.4. 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින	2021 වසරේදී ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන් 310 ක් පැවැත්වීම.			106%
		2021 වසර තුල දීපව්‍යාප්තව ව්‍යවසායකත්ව			436%

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			1% - 50%	50% - 74%	75% - 100%
	තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම	සංවර්ධන වැඩසටහන් 25 ක් පැවැත්වීම			
තිරසර සංවර්ධන අරමුණු 8 - සියල්ලන් සඳහාම පෝෂිත,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය , පූර්ණ ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධන කිරීම	ඉලක්කය 8.5 2030වන විට ආබාධිත පුද්ගලයන් සහ යෞවනයන් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායි හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම	2021 වසර තුල රැකියා අපේක්ෂිතයන් 145,175 ලියාපදිංචි කිරීම	48%		
		2021 වසර තුල රැකියා ඇබෑර්තු 32,600ක් ලියාපදිංචි කිරීම .			80%
		2021 වසර තුල රැකියා අපේක්ෂිතයන් 23,745 ක් රැකියාගත කිරීම	33%		
		2021 වසර තුල ව්‍යාවසායකයින් හා ස්වයංරැකියාලාභීන් 3560 ක් බිහි කිරීම	20%		
		2021 වසර තුල රැකියා අපේක්ෂිතයන් 44,628 සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සිදු කිරීම		69%	

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			1% - 50%	50% - 74%	75% - 100%
		2021 වසර තුල රැකියා අපේක්ෂිතයන් 16,117 ක් පුහුණුව සඳහා යොමු කිරීම		51%	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්

අභියෝග

1. එකම කාර්යය සඳහා විවිධ දෙපාර්තමේන්තු ගත නිලධාරීන් එකම ප්‍රතිලාභීන් පිරිසක් සඳහා සේවා සැපයීමේදී වන ද්විකරණය හා නිලධාරීන් අතර ඇතිවන රාජකාරීමය අවබෝධතාවයන්ගේ විෂමතාවය
2. වෘත්තීය මාර්ගෝපදේශන, රැකියා නිර්මාණ ,ප්‍රවර්ධන කටයුතු සඳහා වාර්ෂිකව මධ්‍යකාලීන අයවැය ප්‍රතිපාදන යටතේ වෙන්වන ප්‍රතිපාදන සීමිත වීම මත පුළුල්ව සේවා සැපයීමට හා සේවා ගුණාත්මය පවත්වා ගැනීමට ඇති වන දුෂ්කරතාවය
3. ප්‍රගති ඇගයුම් සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැති වීම
4. නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා නිරන්තරයෙන් සංවර්ධනය සඳහා ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

06

පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 . සේවක සංඛ්‍යා කළමනාකරණය - 2021.12.31 දිනට

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	20	14	6
තෘතීයික	4	0	4
ද්විතීයික	683	599	84
ප්‍රාථමික	15	10	5

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම

ඉහත වගුව අනුව,විධායක මට්ටමේ තනතුරු20කින් 6 ක් පුරප්පාඩුව පවතින අතර මින් පුරප්පාඩු තනතුරු04ක් ශ්‍රීලංකා පරිපාලන සේවයේ තනතුරු සඳහා වේ. මෙම පුරප්පාඩු සම්පූර්ණ කරදෙන මෙන්සිදුකරන ලද ඉල්ලීම්සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සළකා බලා මෙම දෙපාර්තමේන්තුවේ මෙතෙක් පැවති මාණ්ඩලික ශ්‍රේණියේ පුරප්පාඩු බොහොමයක් මෙම වර්ෂය වන විට සම්පූර්ණ කර දී ඇත.දැනට A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන අප දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ඇති නමුත් අභ්‍යන්තර විගණකවරයෙක් පත් කර නොමැතිඅතර සුදුසු නිලධාරියෙකු ලබාදෙන මෙන් ඉල්ලා ඇත. දැනට කලමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරියකු හා සංවර්ධන නිලධාරීන් තිදෙනෙකු අනුයුක්ත කර අභ්‍යන්තර විගනණ කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

තෘතීයික සේවාවේ තනතුරු ලෙස දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇති පරිපාලන නිලධාරී , භාෂා පරිවර්තක, තොරතුරු තාක්ෂණ නිලධාරී සහ සංඛ්‍යා ලේඛන නිලධාරී යන තනතුරු සියල්ලම මේ වන විට පුරප්පාඩුව පවතී.දැනට දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වා ගැනීම සඳහා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනියක පුරප්පාඩුව පවතින පරිපාලන නිලධාරී තනතුරේ වැඩ බැලීම සිදු කරනු ලැබේ.

ද්විතියික ශ්‍රේණියේ තනතුරු අතරින් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පුරප්පාඩු ත්‍රිත්වයක් පවතින අතර සංවර්ධන නිලධාරී සේවයේද පුරප්පාඩු පවතී.

එමෙන්ම ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු 05ක් 2021.12.31 වන දිනට දෙපාර්තමේන්තුව සතුව පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

කාර්ය මණ්ඩල පුහුණු පිළිබඳ සාරාංශය 2021			
අනු අංකය	**විස්තරය**	**කාලවකවානුව**	**වියදම(රු.)**
	දේශීයපුහුණු		
1	බුද්ධි කලම්හන පුහුණු වැඩසටහන් මාලාව	2021.02.01 – 2021.04.23 දක්වා	85,384.00
2	දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා වන පුහුණු වැඩමුළුව 2021	2021.02.11,12& 13	522,264.50
3	Payment for Diploma in Diplomacy and World affairs	2021	40,000.00

4	කාර්යාල සේවක සේවයේ හා රියදුරු සේවයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන	2021.02.11,12 & 13	85,195.00
5	මධ්‍යම පළාත් නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩමුළුව	2021.03.05,06&07	486,650.00
6	නවක උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා පැවැත්වූ පුහුණු වැඩමුළුව	2021.03.01,03,08,09	15,450.00
6	වෘත්තීය මාර්ගෝපදේශ අංශයේ නිලධාරීන් සඳහා සිදුකරන ලද පුහුණු වැඩසටහන	2021	21,270.00
7	ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා ගෙවීම් කිරීම	2021	40,000.00
8	වෘත්තීයමාර්ගෝපදේශඅංශයේනිලධාරීන්සඳහාසිදුකරනලදපුහුණුවැඩසටහන	2021	155,680.00
9	වෘත්තීයමාර්ගෝපදේශනයපිළිබඳජාතිකඩිප්ලෝමාපාඨමාලාවසඳහාගෙවීම්කිරීම (01 නිලධාරියකුසඳහා)	2021	30,000.00
10	Payroll System පුහුණු වැඩසටහන	2020.06.14,16 & 18	50,000.00
11	පෞද්ගලිකලිපිගොනුකළමණාකරනයපිළිබඳපුහුණුවැඩමුළුව	2020.06.21,22 & 23	20,000.00
12	සුපෝෂණමාර්ගගතපුහුණුවැඩසටහන්මාලාවසඳහාවැයවූගාස්තුවප්‍රතිපූරණයකරගැනීම	2021	7,450.00
13	ඉංග්‍රීසිභාෂාවපිළිබඳඩිප්ලෝමාපාඨමාලාව	2021	75,000.00
14	වෘත්තීයමාර්ගෝපදේශනයපිළිබඳජාතිකඩිප්ලෝමාපාඨමාලාවේගාස්තුප්‍රතිපූරණයකිරීම - 2018/19 කණ්ඩායම	2021	780,000.00
15	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	2021	60,000.00
16	දෙමළ භාෂා පුහුණු වැඩසටහන සඳහා ගෙවීම් කිරීම	2021	15,000.00
මුළු වියදම			**2,489,343.50**

6.4 ආයතනයේ කාර්ය සාධනය සඳහා පුහුණු වැඩසටහන්හි දායකත්වය

2021 වර්ෂය සඳහා අප විසින් දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා දේශීය අවස්ථා ලබා දී ඇති අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉතා ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන ලදී. රට තුළ පැවති කෝවිඩ් - 19 වසංගත තත්වය හමුවේ වෙනත් වර්ෂයන්ට සාපේක්ෂව පුහුණු වැඩසටහන්අඩු සංඛ්‍යාවක් සඳහා නිලධාරීන් සහභාගි කරවීමට සිදු විය.

දෙපාර්තමේන්තුවේ අභිවෘද්ධිය සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මිලියන 2.4ක පමණ පිරිවැයක් දරමින් අප විසින් පුහුණු කරනු ලැබ ඇති අතර ඒ තුලින් කාර්යක්ෂම මහජන සේවයක් ලබා දීම අපගේ අරමුණ විය.



මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

රටක සංවර්ධනය සඳහා තිබිය යුතු මූලික අවශ්‍යතාවය එම රට සතු සම්පත්ය. සම්පත් මනාලෙස කළමනාකරණය කොට ධනය නිෂ්පාදනය කිරීම තුළින් රටක ප්‍රගමනය ඇතිවන බව ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි.


NATIONAL INSURANC













2021 වර්ෂය සඳහා අප විසින් දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා දේශීය අවස්ථා ලබා දී ඇති අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉතා ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන ලදී. රට තුළ පැවති කෝවිඩ් - 19 වසංගත තත්වය හමුවේ වෙනත් වර්ශයන්ට සාපේක්ෂව පුහුණු වැඩසටහන්අඩු සංඛ්‍යාවක් සඳහා නිලධාරීන් සහභාගි කරවීමට සිදු වූ බව දන්වා සිටිනු කැමැත්තෙමි. ඒ තුලින් වඩා විධිමත් සහ කාර්යක්ෂම සේවාවක් මහජනතාවට ලබා දීම අපගේ අරමුණ විය.

07

පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්වාණිජ අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාලනැත		
1.6	වෙනත්	අදාල නැත		
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම මූරෙ((445**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2018/267 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛණ /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ CIGAS පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛණය(GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම**			

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11දිනැති අංක 2004/17 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවටනියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලවේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ (2)134DMA/ 2019-අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018අංක 19දරණ ජාතික විගණන පනතේ (4)40උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4	මුදල් රෙගුලාසි (3)134ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණනවාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
7	**විගණන හා කළමණාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 2019-1අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
8	**වත්කම් කළමණාකරණය**			
8.1	අංක 2017/01දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පර්ච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/05 අනුව භාණ්ඩ සම්ක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සම්ක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මුරෙ 772අනුව සිදුකිරීම	අනුකූල වේ		
9	**වාහනකළමනාකරණය**			

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.1	සංචිතවාහනසඳහාදෛනිකධාවනසට හන්හාමාසිකසාරාංශවාර්තාසකස්කොටනියමිතදිනටවිගණකාධිපතිවෙතඉදිරිපත්කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට අඩු කාලයකදී අපහරණය කිරීම	අනුකූලවේ		
9.3	වාහනලොග්පොත්පවත්වාගනිමින්ඒ වායාවත්කාලීනකරපවත්වාගෙනයැම	අනුකූලවේ		
9.4	සෑමවාහනඅනතුරක්සම්බන්ධයෙන්ම මු.රෙ ,103,104,109හා 110	අනුකූලවේ		
9.5	30/2016 දිනැති 29/12/2016 චක්‍රෙල්කය අනුව වාහන වල ඉංධන දහනය විම නැවත පරීක්ෂා කිරීම	අනුකූලවේ		
9.6	කල්බදුකාලසිමාවෙන්අනතුරුවබදුවා හනලොග්පොත්වලසම්පූර්ණඅයිතියප වරාගෙනතිබිම	අනුකූලවේ		
10	**බැංකුගිණුම්කළමනාකරණය**			
10.1	නියමිතදිනටබැංකුසැසඳුම්ප්‍රකාශපිළි යෙළකරසහතිකකරඒවාවිගණනයසඳ හාඉදිරිපත්කරතිබිම	අනුකූලවේ		
10.2	සමාලෝචිතවර්ෂයේදිහෝඊටපෙරවර්ෂවලසිටඉදිරියටරැගෙනආඅක්‍රියබැංකු ගිණුම්නිරවුල්කරතිබිම	අනුකූලවේ		
10.3	බැංකුසැසඳුම්ප්‍රකාශවලින්අනාවරණය වුහාගැලපුම්කළයුතුවතිබුශේෂසම්බන්ධයෙන්මුදල්රෙගුලාසිප්‍රකාරවකටයුතු කොටඑමශේෂමාසයකකාලයක්ඇතුළතනිරවුල්කරතිබිම	අනුකූලවේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසානිබුප්‍රතිපාදනඒවායේසිමාවඉක්මවානොයනපරිදිවියදම්දැරිම			
11.2	මුරෙ (1)94ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේදි ඉතිරි ප්‍රතිපාදන සිමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල නොවේ	අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබිම හේතුවන් ලබා දුන් සිමිත ප්‍රතිපාදන ඉක්මවා අත්‍යවශ්‍ය වියදම් දැරිමට සිදුවිම	අත්‍යවශ්‍ය වියදම් සඳහා ඉල්ලුම් කරන ප්‍රතිපාදන ලබා දිම
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සිමාවන්ට අනුකූලවිම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබිම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12.3	වර්ෂයකට වැඩිකාලයක සිට පැවත එන හිටිණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුරෙ 571ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මුරෙ 371ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වි මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මුරෙ 371ප්‍රකාරව අනුමත සිමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මුරෙ 176අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානවසම්පත්කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	තිදිනැ 20.09.2017MSD චක්‍රලේඛ අංක කාරව සියලුම වාර්තා ප්‍ර 2017/04 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසාවෝදනා පල / .කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 8 හා 10 අනුකූලව වාර්තා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක (1)2018/05 හා 2008/05දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි සේවා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ ඡේදය පරිදි 2.3, පුරවැසිඥප්තිය සේවාලාභී ප්‍ර/ සම්පාදනය කිරීම හාක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**.			
19.1	පරිපාලන දිනැති රාජ්‍ය 2018.01.24 02 ඇමුණුම 2018/02 ලේඛ අංකචක්‍ර ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සැලැස්ම තුළ තහවුරු කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ /අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම් හි දැක්වෙන 01ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ	සමස්ත කාර්ය මණ්ඩලයඇතුළත් කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමේදි දිවයින පුරා සිටින නිලධාරින් ප්‍රධාන කාර්යාලයට ගෙන්වීමේදි ඇතිවූ අපහසුතා මත 2021 වර්ෂයේදි එය ක්‍රියාත්මක කළ නොහැකි විය.	දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් හරහා ගිවිසුම් අත්සන් කරගැනීමට අදාළ ආකෘති පත්‍ර යොමු කිරීම.
19.4	ඉහත චක්‍රලේඛයේ ඡේදය 6.5 සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම .	අනුකූල වේ		
20	**විගණනඡේදවලටප්‍රතිචාරදැක්වීම**			
20.1	ඉකුත්වර්ෂසඳහාවිගණකාධිපතිවිසින් නිකුත්කලවිගණනඡේදමඟින්පෙන්වා දිඇතිඅඩුපාඩුනිවැරදිකොටතිබීම	අනුකූලවේ		